# කේතුමතී රාජධානිය

සම්පාදක
පූජ්‍යපාද කොටුගොඩ ධම්මාවාස
අනුනායක ස්වාමීන්ද්‍රයාණන් වහන්සේ

# කේතුමතී රාජධානිය

ප්‍රථම මුද්‍රණය : 2000
දෙවන මුද්‍රණය : 2016

© : පූජ්‍යපාද කොටුගොඩ ධම්මාවාස හිමි

මුද්‍රණය

දිමුතු මුද්‍රණාලය

අංක 103/A, නුවර පාර, යක්කල.
දුර: 033-2239662 / 077-8829705
විද්‍යුත් තැපෑල: dimuthupub@yahoo.com
දහම් පොත් කියවීම සඳහා පිවිසෙන්න.
වෙබ්: www.dhammadanabooks.com

# කේතුමතිය

අනාගතයෙහි ලෝකයේ පහළ වන මෛත්‍රී බුදුරජාණන් වහන්සේ උපත ලබන්නේ දඹදිව කේතුමතී රාජධානියෙහි බව බෞද්ධ ධර්ම ග්‍රන්ථයන්හි සඳහන් වේ. සොළසාසංඛ්‍ය නොහොත් දහසැය අසංඛ්‍ය කල්ප ලක්ෂයක් පුරා පුරණ ලද පාරමී ධර්ම ඇති ඒ ශ්‍රේෂ්ඨතම මහෝත්තමයන් වහන්සේ නිසා අපරිමිත සංඛ්‍යාවක් දෙවියන් සහිත මනුෂ්‍යයන් සෝවාන් ආදී මගඵලවලට පත්ව නිවන් දක්නාහ. එසේම උන්වහන්සේගේ බණ දහම් ඇසීමෙන් දෙව් මිනිස් සම්පත් හා බ්‍රහ්මලෝකවල බඹ සම්පත් ලබන්නෝ අපමණ ය. අපගේ ගෞතම බුදුරාජාණන් වහන්සේට වඩා සිව්ගුණයක කාල ප්‍රමාණයක් පෙරුම්දම් පිරීමේ පුණ්‍ය බලය නිසා මෙතේ බුදුන් පහළවන සමය ලෝකයා සුඛිත මුදුත බවට පත්වූ කාල පරිච්ඡේදයකි. දඹදිව කේතුමතී රාජධානිය ද පිනෙන් පිරුණු දිව්‍යලෝක බ්‍රහ්මලෝක සහ අනෙකුත් බලගතු ග්‍රහලෝකවල සිට චුතව මෙහි උපත ලද්දෝ ම වීම එයට හේතුවයි. ගෞතම බුද්ධ ශාසනයෙහි විවිධ පින්කම් කොට ''මෙතේ බුදුන් දැක නිවන් දකින්නෙමු'' යි දාන සීල භාවනාදී පින්කම්හි යෙදුණෝ ද ඒ මෙතේ බුදුන් සමයෙහි උපත ලබති. පලාඵලවල රසවත් බව - ධාන්‍ය වර්ගවල ඕජෝ ගුණය සහ ප්‍රණීත බව - දේශගුණයෙහි පවත්නා වූ අතිශයින් ම සුවදායක බව මේ පුණ්‍යවන්ත කාලයෙහි ස්වාභාවික තත්ත්වය වන්නේ ය.

මේ කරුණු නිසා මෙරට පිටරට බෞද්ධයෝ මෛත්‍රී බුදුරදුන් පිළිබඳව අතිශය බලාපොරොත්තු සහිතව සිටින බව පැහැදිලිය. අපේ බණ පොත්වල ද මේ ගැන සඳහන් වන කරුණු චමත්කාර ජනකය. ගෞතම බුදුරදුන් දේශනා කළ බව සඳහන් වන ඒ කරුණු අලලා කාටත් තේරුම්ගත හැකි පරිදි මෙබඳු ධර්ම ග්‍රන්ථයක් සැපයීමට අදහස් කොට, මෙයට වසර හයකට කලින් ද එනම් 1994 වෙසක් කලාපය වශයෙන් ''මෛත්‍රී බුදුරදුන්'' නමින් ග්‍රන්ථයක් දෙහිවල බෞද්ධෝදය සංගමයේ ආරාධනා පරිදි ප්‍රකාශයට පත්විය. එයින් පසු ද අවස්ථා දෙක තුනකදී සැදැහැවත් බෞද්ධ ප්‍රභූන් කීපපළක් විසින් මේ පොත දෙහිවල බෞද්ධෝදය සංගමයෙන් අවසර ලබාගෙන දහස් ගණනින් මුද්‍රණය කොට ධර්ම දානය පිණිස නොමිලේ බෙදාහරින ලදහ. දිනපතා මේ ''මෛත්‍රී බුදුරදුන්'' පිළිබඳ පොත ලබාගැනීමට පැමිණෙන පින්වතුන් වැඩිවීම හා ඒ සඳහා ඉල්ලුම් කරන ලිපි දවසින් දවස වැඩිවන බැවින්, එම පොත ම සංශොධන සහිතව කලින් පොතෙහි නො ලියැවුණු කරුණු ද ඇතුළත් කොට තිබේ. ''කේතුමතී රාජධානිය'' නමැති මේ බණ පොත එම තීරණයෙහි ප්‍රතිඵලයකි.

දෙහිවල බෞද්ධෝදය සංගමය මාසික වශයෙන් ධර්ම පත්‍රිකා පසළොස් දහසක් මුද්‍රණය කොට මෙරට විවිධ ප්‍රදේශවල වෙසෙන ධර්ම කාමී බෞද්ධ පින්වතුන් වෙත යවනු ලැබේ. සෑම වෙසක් පුර පසළොස්වක් පොහෝ දිනකම වැදගත් මාතෘකාවක් යටතේ ලියැවුණු කුඩා ධර්ම ග්‍රන්ථයක් ද වාර්ෂික වෙසක් කලාපය වශයෙන් නිකුත් කිරීම දෙහිවල බෞද්ධෝදය සංගමයෙන් කෙරෙන විශිෂ්ට බෞද්ධ ධර්මදූත සේවාවකි. මේ පොත හොඳින් පරිශීලනය කොට එහි සඳහන් කරුණු තම සිත්සතන්හි පිහිටුවාගෙන ගුණවත් කෙනෙකුන් වීම ඉතා වැදගත්ය. සමාජයෙහි සාමය සමාදානය සදාචාරවත් බව සහ සෞභාග්‍ය පිණිස මිනිස් පරපුර යොමුකර ගත හැක්කේ මෙබඳු ධර්ම කරුණු දැන ඉගෙන ගැනීමෙනි. ධර්මයෙහි එන අනාගත වංස දේශනාව'' නමැති ග්‍රන්ථය මේ කුඩා බණ පොතට ගුරු වූ බව සඳහන් කිරීමට කැමති යි. බෞද්ධෝදය සමිතිය ඉදිරියටත් මෙවන් ධර්ම දානමය පින්කම් කිරීමට තව තවත් ශක්තිමත් වේවා. යි ප්‍රාර්ථනා කරමි.

ශ්‍රී ධර්මපාලාරාමය
ශ්‍රී ධර්මපාල පාර, ගල්කිස්ස

මෙයට
**කොටුගොඩ ධම්මාවාස ස්ථවිර**

භව කතරින් එතෙර වීමට ඇවැසි මනා
සිහිණුවනත් නිරෝගීභාවයත් ලැබේවා යන
අධිටනින් යුතුව ධර්ම දානය පිණිස මුද්‍රණය
කරවන ලදී.

**2016 සැප්තැම්බර් මස**

# කේතුමතී රාජධානිය

ලෝකය විවිධ ය. විෂම ය. භින්න රුචික ය. එනිසා ලෝකයෙහි සැමදා අවුල් වියවුල්, දුක් දොම්නස්, කම්කටොළුවල නිමාවක් නැත. මිනිසා ප්‍රධාන සකල සත්ව ප්‍රජාව ම තෘෂ්ණාව නම් වූ ආශාව නිසා සාංසාරික දුකින් එතරවිය නොහී දිගින් දිගට ම ඒ ඒ තන්හි උපත ලබමින් විවිධ සුභ අසුභ කර්ම රැස්කෙරෙති. කුසල අකුසල නමින් හඳුන්වන්නේ එකී කර්මයෝ ය. මෙසේ සාංසාරික ගමනට මූලික හේතුව බැඳීම නමින් දක්වෙන තෘෂ්ණාව ම බව කිව යුතුය. මේ ආශාව පවතින තාක් කල් සසර ගමන කෙළවර කළ හැකි නොහේ. ත්‍රිවිධ පුණ්‍ය ක්‍රියාවන් නිසිපරිදි සපුරාගත් පින්වත්හු බුදු බව - පසේබුදු බව - රහත් බව යන තුන්තරා බෝධියෙන් එක්තරා බෝධියකට පත්ව නිවන අවබෝධ කිරීමෙන් දුකින් එතෙර වෙති. නැවත නූපදින තත්ත්වයට පත්වෙති. තථාගත බුදු පියාණන් වහන්සේ පෙන්වා වදාලේ මේ නිවන් මාර්ගයයි.

සම්මා සම්බුදුරජාණන් වහන්සේලා තුන් ආකාර වෙති. ප්‍රඥාධික - ශ්‍රද්ධාධික - විර්යාධික යනු ඒ තුන් ආකාරයයි. ප්‍රඥාධික බුදුරජාණන් වහන්සේලාගේ බෝධිසත්ව කාලය සාරා සංඛ්‍ය කල්ප ලක්ෂයෙකි. අපගේ ගෞතම බුදු පියාණෝ ප්‍රඥාධික බුදුවරයෙකි. සියළුම බෝසත්වරු දශ පාරමිතා තෙවදෑරුම් ලෙස සම්පූර්ණ කෙරෙති. ශ්‍රද්ධාධික බෝධිසත්වයන් වහන්සේලාගේ බෝධිසත්ව කාලය අට අසංඛය කල්ප ලක්ෂයකි. මේ මහා භද්‍රකල්පයෙහි තුන් වැනි වරට ලොව පහළ වූ කාශ්‍යප බුදුරජාණන් වහන්සේ එබඳු බුදුවරයාණ කෙනෙකි.

දහසය අසංඛ්‍ය කල්ප ලක්ෂයක් පාරමිතා ධර්ම සපුරා බුදු බවට පත් වන බුදුවරයන් වහන්සේලා වීර්යාධික බුදුවරයෝ ය. අනාගතයෙහි ලෝකයෙහි පහළ වන මෛත්‍රී බුදුරජාණන් වහන්සේ ද මෙබඳු මහෝත්තමයාණන් වහන්සේ නමකි. මෙකී සම්මා සම්බුදුරජාණන් වහන්සේලා අතර ඍද්ධි බල පිළිබඳව, සර්වඥතාඥානය පිළිබදව කිසිදු වෙනසක් නැත. පරස්පර බවක් උස් පහත් බවක් නැත. එහෙත්, මේ බෝසතාණන් වහන්සේලා පෙරුම්දම් පිරූ කාලයෙහි අඩු වැඩි බව අනුව ඒ බුදුරජාණන් වහන්සේලා පහළ වන කාලයන්හි වෙනස්කම් ඇතිවේ

අපගේ ගෞතම බුදුරජාණන් වහන්සේ පහළවූ සේක්, මිනිසාගේ පරමායුෂ අවුරුදු එකසිය විස්සකට පැවිති කාලයෙහිය.

උන්වහන්සේට දේවදත්ත, නිගණ්ඨාදීන්ගේ විවිධ බාධක වලට මුහුණ දීමට සිදුවිය. ලෝකයෙහි පාප බලයට අධිපති වසවත් මරුගෙන් පැමිණි පළිබෝධ බොහෝ ය. මිනිසුන්ගේ ආයුෂ පෙර බුදුවරුන්ගේ කාලවල මෙන් නොව අල්පායුෂ්ක විය. එයට හේතුවූයේ උන් වහන්සේ පාරමී ධර්ම පිරූ කාල පරිච්ඡේදය සාරසංඛ්‍ය කල්ප ලක්ෂයක් වීමයි. තියුණු වූ බුද්ධිමය බලයෙන් අඩු කාලයක් පාරමීදම් පුරා ලොව්තුරා බුදු බවට පත්වන ප්‍රඥාධික බුදුවරයන් වහන්සේලාගේ ගණයට අපගේ ගෞතම බුදුරජාණන් වහන්සේ ද අත්වන්නේය. උන්වහන්සේ විසින් සසර දුකින් එතෙර කොට නිවන් මගට පමුණුවන ලද දෙවියන් බ්‍රහ්මයන් මනුෂ්‍යයන් සහිත සකල විධ සත්වයෝ සූවිසි අසංඛ්‍යයකි.

ශ්‍රද්ධාධික සම්මා සම්බුදු රජාණන් වහන්සේලා අටාසංඛ්‍ය කල්ප ලක්ෂයක් පාරමිතා ධර්ම පුරන්නෝ ය. බෝධිසත්ව කාලවල පටන් උන්වහන්සේලා ප්‍රඥාවට වඩා ශ්‍රද්ධාව බහුල කොට ඇත්තෝ ය. එතුමෝ පහළ වන කාල වඩා සෞභාග්‍ය සම්පත්තියෙන් අනූන වෙති. පෙරුම්දම් පිරූ කාල පරිච්ඡේදය විශාල හෙයිනි.

තුන් වන කොටසට වැටෙන්නෝ වීර්යාධික සම්මා සම්බුදුරාජයාණන් වහන්සේලා ය. එතුමෝ දහසය අසංඛ්‍ය කල්ප ලක්ෂයක් පාරමී දම් පිරුවාහු වෙති. අනාගතයේදී ලෝකයේ පහළ වන මෛත්‍රී බුදුරජාණන් වහන්සේ ද වීර්යාධික බුදුවරයෙකි. අප බුදුරජාණන් වහන්සේ පහළ වූ යුගයට වඩා උන්වහන්සේ පහළ වන මෛත්‍රී බුදුරජාණන් වහන්සේ පහළ වූ යුගයට වඩා උන්වහන්සේ පහළ වන කාලපරිච්ඡේදය අග්‍ර ලෙස සෞභාග්‍ය සම්පත්තියෙන් උත්තරීතර ය. මේ මහා භද්‍ර කල්පයෙහි අවසන් වරට පහළ වන බුදුරජාණන් වහන්සේ ද මෛත්‍රී සර්වඥයන් වහන්සේ ය. මෙසේ ඒ ඒ බෝධිසත්වයන් වහන්සේලා සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයක් පාරමී ධර්ම සම්පූර්ණ කළ යුත්තේ නියත විවරණය ලැබීමෙන් පසුව ය. ඊට පෙරාතුව ඒ සෑම බෝසත්වරයෙක් ම.

**1. මනෝ ප්‍රණිධානය**

**2. වාග් ප්‍රණිධානය**

සම්පූර්ණ කළ යුතුය. මනෝ ප්‍රණිධානය නම් ඒ ඒ පුණ්‍යකර්මයන් සිදුකොට මේ පින් බලයෙන් බුදු බව ලැබේවා.! යි සිතින් ප්‍රාර්ථනා කිරීම යි. මේ මනෝ ප්‍රණිධානය නම් පුණ්‍ය

කර්මයන් සිදු කොට මේ පිනින් මට බුදු බව ලැබේවා.! යි වචනයෙන් ම කියා ප්‍රාර්ථනා කිරීම යි. සත් අසංඛ්‍ය කල්ප ලක්ෂයක් මනො ප්‍රණිධානය සම්පූර්ණ කළ බෝසත්වරයා ඉන්පසු වාග් ප්‍රණිධානය නවාසංඛ්‍ය කල්ප ලක්ෂයක් මුළුල්ලෙහි පිරිය යුතුය. මෙසේ සොළසාසංඛ්‍ය කල්ප ලක්ෂයක් මනෝ ප්‍රණිධානය හා වාග් ප්‍රණිධානය සම්පූර්ණ කළ බෝසත් වරයකුට ජීවමාන බුදු කෙනකුන්ගේ සමීපයෙහිදී නියත විවරණය ලබාගත හැකිය. එම නියත විවරණය ලබන ආත්මයේදී බෝධිසත්වයන් වහන්සේ කරුණු අටකින් සම්පූර්ණත්වයට පැමිණ සිටිය යුතුය. ඒ කරුණු අට නම්,

**මනුස්සත්තං ලිඞ්ග සම්පත්ති - හේතු සත්ථාර දස්සනං**
**පබ්බජ්ජා ගුණ සම්පත්ති - අධිකාරෝ ච ඡන්දතා**
**අට්ඨධම්ම සමෝධානා - අභිනීහාරෝ සමිජ්ඣති**

මනුෂ්‍යාත්ම භාවයක් ලැබීම - පිරිමියෙක් වීම - හේතු වාසනා ඇත්තකු වීම - ශාස්තෲන් වහන්සේ දැකීම - පැවිදි වී සිටීම - ගුණසම්පත්තියෙන් යුක්ත වීම - අධිකාරය හා ඡන්දය යනු ඒ කරුණු අටයි.

මෙම ගාථාවෙන් පළමු වැනි සුදුසුකම වශයෙන් දක්වා අත්තේ මනුෂ්‍ය ආත්මභාවයක් ලැබිය යුතු බව ය. නියම මිනිස් ආත්මභාවය යනු යහපත් රටක, යහපත් ප්‍රදේශයක යහපත් ගති පැවතුම් ඇති මව්පියන්ට දාව, ඇස් කන් නාසාදිය හරියට ඇති, හොඳ නරක පිළිබඳ විශ්වාසයක් ඇති පස් පවින් වැලකුණ, ගුණගරුක සත්පුරුෂ පුද්ගලයෙක් ව උපත ලැබීම යි. ලිඞග සම්පත්ති යනු පිරිමියෙක්ව ම උපත ලැබීම ය. ස්ත්‍රී ආත්මයෙන් තොරව නපුංසකාදී තත්ත්වයන්ට නොවැටී, ඉහත සඳහන් පරිදි පුරුෂ ආත්මභාවයක් ලැබීම ය. නියත විවරණය ලබන බෝසත් වරයකුට අවශ්‍ය දෙවන සුදුසු කම මෙය යි.

හේතු සම්පත්තිය නමින් දක්වෙන්නේ බුදු කෙනකුන් වෙතින් ප්‍රථම වරට නියත විවරණය ලබන පුද්ගලයා ඒ ආත්මභාවයේදී කෙලෙසුන් නසා රහත් වීමට තරම් අවශ්‍ය පින් ඇති කෙනෙකු විය යුතු බව ය. සත්ථාරදස්සනං යනු සම්මා සම්බුදුරජාණන් වහන්සේ නමක් අභිමුඛයෙ දීම ''මේ පින්වත් පුද්ගලයා මෙපමණ කලකින් මෙකී නමින්, ලොව්තුරා බුදු බවට පත්වන්නේ ය. යන ස්ථිර අනාවැකිය ලබාගැනීම යි. ප්‍රථම නියත

විවරණය ලබන මහබෝසත්වරයා ගිහිගෙයින් වෙන් වූ අනගාරික පුද්ගලයෙක් ම විය යුතු ය. පැවිදි ජීවිතයක් හෝ කර්ම විපාක පිළිගනු ලබන තවුස් ජීවිතයක් ගතකරන්නකු විය යුතුය. පබ්බජ්ජා යනු එය යි.

හයවැන්නෙන් දක්වෙන ගුණ සම්පත්තිය යනු ඛණ භාවනා කිරීමෙන් උපදවාගත් ප්‍රථම ධ්‍යාන ද්වීතිය ධ්‍යාන ආදී ධ්‍යාන සමාපත්ති ඇති කෙනෙකු විය යුතු බව ය. හත් වැනි ව කියැවෙන ''අධිකාරෝ ච'' යනු බුදුරදුන් වෙනුවෙන් තම ජීවිතය පූජා කිරීමට වුවද චිත්ත ශක්තියක් ඇති - කැප කිරීමක් කළ හැකි කෙනකු වීම ය. එබඳු දැඩි ශක්තිමත් බවක් ප්‍රථම වරට බුදුවරයන් වහන්සේ නමක් වෙතින් නියත විවරණය ලබන බෝසත්වරයා වෙත තිබිය යුතු ය. අට වැන්නෙන් කියැවෙන ඡන්දතා යන්නෙන් අර්ථවත් කෙරෙන්නේ බුදුබව ලබාගැනීමට අදාල වන දස පාරමිතා ධර්මයන් සපුරා ගැනීමේ දැඩි ආශාව ය. කැමැත්ත ය. මෛත්‍රී බෝසතාණෝ ද මේ සුදුසුකම් අනුව නියත විවරණ ලද උතුවෙකි.

මෛත්‍රී බුද්ධ ශාසනයෙහි නිවන් දැකීමට පතන පුණ්‍යකාමීහු බොහෝ ය. ඒ සර්වඥයෙන් වහන්සේගේ මහා පුණ්‍ය අසිරිය සියල්ලන් විසින් ම දැනගැනීමට කැමති බැවින් මේ කුඩා ග්‍රන්ථයෙන් ඒ පිළිබඳව සංක්ෂිප්ත සටහනක් ඉදිරිපත් කරේ. සකල ගුණ නිධාන වූ කරුණාවෙන් සිසිල් වූ සම්මා සම්බුදු රජාණන් වහන්සේ විසින් බුද්ධවංස දේශනාව අවසානයේදී සැරියුත් මහ රහතන් වහන්සේගේ ආරාධනාවෙන් අහසෙහි රුවන් සක්මනක් මවා මේ අනාගතවංස දේශනාව වදාළ සේක.

බුදුපියාණන් වහන්සේ විසින් කිඹුල්වත් නුවර නිග්‍රෝධාරාමයේදී වදාළ මේ අනාගත වංශ දේශනාව ඇසීමෙන්, තම සිත්හි සිහිටුවා ගැනීමෙන්, එහි ඇතුළත් ගුණධර්ම පිළිපැදීමෙන් අනාගතයේ ලෝකයේ පහළ වන ඒ මෙතේ බුදුන් දැක නිවනට පැමිණිය හැකි වන්නේය මේ අනාගත වංශ දේශනාව මෙයින් අවුරුදු පන්සිය අනූවකටත් හයසිය විසිනමයකටත් අතර කාලයෙහි විල්ගම්මුල සංඝ රජයාණන් වහන්සේ විසින් දෙවැනි පැරකුම්බා රජු දවස ලියන ලද බව සඳහන් වේ. මේ එහි සංක්ෂිප්ත විස්තරයක් බව සැලකිය යුතුය.

සිද්ධාර්ථ ගෞතම බුදුරජාණන් වහන්සේ බුදු බවට පත්ව සත් සති ගෙවා බරණැස ඉසිපතනයට වැඩම කොට ධර්මචක්‍ර ප්‍රවර්තන සූත්‍ර දේශනාවෙන් දෙවියන් සහිත සකල ලෝකයාට ම

ධර්මාලෝකය බෙදාදුන් සේක. ඒ සඳහා උන්වහන්සේ උනන්දු කරවූයේ සහම්පතී බ්‍රහ්ම රාජයා විසිනි. මා විසින් දුකසේ අවබෝධ කරගන්නා ලද මේ චතුරාර්ය සත්‍ය ධර්මය ප්‍රකශ කිරීමෙන් වැඩක් නැත. රාග ද්වේශ මෝහාදියෙන් වෙළුණු මනුෂ්‍යයන්ට මේ ධර්මය අවබෝධ කළ නොහැකි ය. යැයි මන්දෝත්සාහී වූ විට සහම්පතී මහා බ්‍රාහ්මයා පැමිණ මෙසේ ප්‍රකාශ කළේය.

**''නස්සති වත භෝ ලෝකෝ, විනස්සති වත භෝ ලෝකෝ යත්ථ හි නාම තථාගස්ස අරහතෝ සම්මා සම්බුද්ධස්ස අප්පොස්සුක්කතාය චිත්තං නමති නො ධම්මදේශනාය...''**

භාග්‍යවත් බුදරජාණන් වහන්ස, යම් අවස්ථාවක රහත් වූ සම්මා සම්බුදු රජාණන් වහන්සේගේ සිත ධර්ම දේශනාව සඳහා නො නැමේ ද එය ලෝකයට විනාශයකි

**''දේසේතු භන්තේ භගවා ධම්මං, දෙසේතු සුගතෝ ධම්මං සන්ති සත්තා අප්ප රජක්ක ජාතිකා. අස්සවණතා ධම්මස්ස පරිහායන්ති. භවිස්සන්ති ධම්මස්ස අඤ්ඤාතාරෝ.''**

ස්වාමිනී, භාග්‍යවතුන් වහන්ස, නොපැකිලිව දම් දෙසන සේක්වා.! රාගිදී කෙළෙස් අඩු සත්වයන් කොතෙකුත් ඇත. ඔවුහු ධර්මය නොඇසීමෙන් පිරිහෙති. දහම් දැනගන්නෝ, ධර්මය අවබෝධ කරගන්නෝ ලෝකයෙහි සිටිති. මෙසේ සහම්පති බ්‍රහ්මරාජයාගේ උනන්දු කරවීමෙන් ප්‍රථම ධර්ම දේශනාව සඳහා පස්වග මහණුන් සොයා බරණැස ඉසිපතනයට වැඩම කළහ. මෙම ප්‍රථම මංගල ධර්ම දේශනාවෙන් පසු රජගහනුවරට වැඩම කොට බිම්බිසාර මහාරාජයා විසින් පූජාකරන ලද වේළුවනාරාමයට වැඩමකළ සේක. මේ වකවානුවේ දී තථාගතයන් වහන්සේ එහි වෙසෙන බව සුද්ධෝධන මහාරාජයාට දැනගන්නට ලැබිණ. එතුමා දහසක් පිරිවර සහිතව අමාත්‍යවරයකු පුතණුවන් වහන්සේ කැඳවාගෙන ඒම සඳහා සැට යොදුනක් දුරින් පිහිටි රජගහනුවරට යැවීය ඇමතිවරයා පිරිසත් සමග ගොස් බුදුරජාණන් වහන්සේ දැක බණ අසා සියළු දෙනා සමගම පැවිද්දට පත්වූහ. එයින් පසු ද අට වරක ඇමතිවරු අටදෙනෙක් යටතෙහි අට දහසක් යැවූ නමුදු ඔවුහු ද බුදුරජාණන් වහන්සේගෙන් බණ අසා රහත් බවට පත්ව

ඒහිභික්ෂුභාවයෙන් පැවිද්දට පැමිණියහ.

මෙසේ වාර නවයක් ම ඇමතිවරු නව දෙනෙක් සහිත නව දහසක් යැවූ නමුදු පුතණුවන් වහන්සේ නොපැමිණි බැවින් දස වැනි වරට කාලුදායි අමාත්‍යයා යවන ලද්දේ ය. ඔහු ද දහසක් පිරිස කැටුව ගොස් බුදුන් දැක බණ අසා පිරිසත් සමගම පැවිද්දට පත්ව බුදුරදුන් ප්‍රධාන විසිදහස් ගණනක මහරහතුන් පිරිවරාගෙන ශාක්‍ය දේශයට පැමිණියහ. භාග්‍යවතුන් වහන්සේ ඇතුළු සියළු දෙනා වහන්සේට ම කපිලවස්තුපුර නිග්‍රෝධාරාම නමැති දැකුම්කළු, මහා උද්‍යානය පුරා අලංකාර කුටි, ගෙවල්, ශාලා, පැන් පොකුණු, සක්මන්මළු, දිවා විහරණයට සුදුසු තැන් සම්පූර්ණ කොට බුදුරජාණන් වහන්සේ ගෞරවයෙන් පිළිගෙන එහි නේවාසික පහසුකම් සලසාලූහ. මේ අතර ඇතැම් වැඩිමහල් ශාක්‍ය රාජ රාජ මහාමත්‍යාදීන් අතර දැඩි මානය නිසා සිද්ධාර්ථ කුමාරයන් අපට වඩා බාල ය. අපි කෙසේ එතුමන්ට වඳිමු දැයි කුතුහලයක් ඇති කොට ගෙන තථාගතයන් වහන්සේ පිළිගැනීම සඳහා ඉදිරියට නොපැමිණියහ. මෙය දැනගත් බුදුපියාණෝ ඔවුන්ගේ මානය බිඳිණු පිණිස යමක මහා ප්‍රාතිහාර්යය දැක්වූ සේක.

මේ යමක මහා ප්‍රාතිහාර්යය දක්වාලිය හැක්කේ සම්මා සම්බුදු රජාණන් වහන්සේනමකට පමණි. ඉතා ක්ෂණිකව සමාපත්ති දෙකකට සමවදිමින් එකවර පෙනෙන සේ අන්ධකාරයත්, ආලෝකයත් මැවිය හැකි ඍද්ධි බල මහිමය මේ යමක මහා ප්‍රාතිහාර්යය නමින් දක්වා ඇත. මෙසේ ජල කඳක්, ගිනිකඳක් බඳු එකිනෙකට ප්‍රතිවිරුද්ධ දෙකක් දක්වාලිය හැකි සූක්ෂම ඍද්ධි බලය මෙයින් අදහස් කරයි. එවන් යමක මහා ප්‍රාතිහාර්යය දැක්වීමෙන් පසු බුද්ධාලම්බන ප්‍රීතියෙන් ප්‍රමුදිත බවට පත් සියල්ලන් වෙනුවෙන් ආයුෂ්මත් සාරිපුත්‍ර මහරහතන් වහන්සේ අනාගතයේ පහළ විය හැකි බුදුරජාණන් වහන්සේලා පිළිබඳව විමසූහ. බුදුරජාණන් වහන්ස, අනාගතයෙහි මෛත්‍රී නාමයෙන් ලොවුතුරා බුදුකෙනෙකු පහළවන බව ඔබ වහන්සේ වදාරණ ලදී. ඒ බුදුරජාණන් වහන්සේ කෙබඳු ආකාර ඇතිසේක් ද? අප කෙරෙහි අනුකම්පාවෙන් මෛත්‍රී බුදුරදුන් පිළිබඳව ප්‍රකාශ කරන සේක්වා යැයි ඉල්ලීමක් කළහ. එය පිළිගත් බුදුරජාණන් වහන්සේ අනාගත වංසය නම් වූ මේ සම්බුද්ධ චරියාව මෙසේ වදාළහ.

**ඉමම්හි භද්දකෙ කප්පේ - අසඞ්ඛ්‍යානෙ වස්ස කෝටියේ**
**මෙත්තෙය්‍ය නාම නාමේන - සම්බුද්ධෝ දිපදුත්තමෝ**

මේ මහාභද්‍ර කල්පයෙහි අවුරුදු ලක්ෂ ගණනක් ඉක්මයාමෙන් පසු මෙත්තෙය්‍ය නම් ද්විපදෝත්තමයන් වහන්සේ පහළවන සේක. සම්මා සම්බුදු රජාණන් වහන්සේලා එක් කල්පයක් තුළ පස් නමක් බුදු වුවහොත් එම කල්පය මහාභද්‍ර කල්පය නම් වන්නේ ය. ඊට වඩා බුදුවරු ගණනක් එක් කල්පයක් තුළ කිසිසේත් පහළ නොවෙති.

කල්ප විනාශය සිදුවීම පටන්ගත් කල්හි පළමුවෙන්ම ඉතා දැඩි වර්ෂාවක් ඇති වෙයි. එයින් මහත් සේ සතුටට පත් මනුෂ්‍යයෝ තම තමන්ගේ සියළු භෝග වගාවන් පටන් ගනිති. භෝග පැල හටගන්නා විට වැසි වැසීමට සූදානම් වන්නාක් මෙන් මේඝ ගර්ජනාවන් ඇතිවේ. එහෙත් එක වැහි බිඳුවකුදු නො වසී. එතැන් පටන් දිගු කලක් වැහි පොදක්වත් දක්නට නොලැබේ. වැව් පොකුණු සිඳී යයි. ගංගාවන් වියලීයාම නිසා ගස් කොළන් මැරී, සතුන් මැරී, මිනිසුන් ද මැරීයන්නට පටන් ගනී. මේ කාලයෙහි ස්වල්ප වශයෙන් වුවද පින් ඇති ස්ත්‍රී පුරුෂයෝ මැරීගොස් දිව්‍ය ලෝක වල උපදිති. එහිදී ධ්‍යාන උපදවා ඇතැම් කෙනෙක් බඹලොව උපදින්නාහු ය. කලක් ගතවූ විට දෙවැනි ඉරක් පායන්නට පටන් ගනී. මෙවන් අයුරින් සූර්යයෝ සත් දෙනෙක් පායන්නට පටන් ගනිති. ඒ වන විට සියළු සත්වයන් විනාශවී මහා සමුද්‍රය පවා වියලී ගොස් නිමය. මෙයින් සත් වැනි ඉර පායත්ම මුළු පෘථිවි ධාතුවම එකම ගිනිජාලයක් සේ ඇවිල යන්නේ ය.

මහ පොළව විනාශ වීමෙන් මුළු අජටාකාශය මහ ඝණ අඳුරකින් වැසී යයි. මහා පෘථිවිය විනාශ වීමෙන් පසු චතුර්මහාරාජිකය, තාවතිංසය, යාමය, තුසිතය, නිර්මාණරතිය, පරනිම්මිත වස්වර්තිය යන සදෙවුලොව ද බ්‍රහ්ම පාරිසජ්ජ, බ්‍රහ්ම පුරෝහිතාදී වශයෙන් දැක්වෙන බ්‍රහ්ම ලෝක පහක් ද විනාශයට පත්ව ආභස්සර බඹලොව දක්වා දැවී යන්නේය. එතැන් පටන් අවුරුදු දස දහස් ගණනකටත් වඩා ඉක්ම ගිය විට මහා සම්පත්තිකර වර්ෂාවක් ඇතිවී මහත් ජල ධාරාවන් පතුරුවමින් මුළු සක්වල ධාතුව ම තෙත් බවට - සිසිල් බවට පත් කරනු ලබයි. ඉන් පසු බ්‍රහ්ම ලෝකය, දිව්‍ය ලෝකය, මහපොළව, මහා සමුද්‍රය, ඉර හඳ තාරකා යන මේ නම් වලින් දැක්වෙන සියළු ම දහස් ගණන් ග්‍රහ

ලෝකයන් පහළ වන්නට පටන් ගනී.

ඉහත සඳහන් පරිදි කල්පාන්තරයක් ඉක්ම ගිය කල්හි පළමු පරිද්දෙන් ම ලෝකය ප්‍රකෘතිමත් වෙයි. ලෝක විනාශයට පළමුව පටන් ගත් වර්ෂාවෙහි පටන් සියල්ල දැවී විනාශ වී ගොස් නැවත ලෝකය හට ගැනීමට පටන් ගනී.

I. සංවට්ඨ කල්පය
II. සංවට්ඨට්ඨායී කල්පය
III. විවට්ඨ කල්පය
IV. විවට්ඨවට්ඨායි කල්පය

යනුවෙන් කල්ප සතරකි. මෙයින් පළමුවෙන් සඳහන් කළ සංවර්ත කල්පයේදී ලෝකය ඉහත සඳහන් කළ පරිදි ගින්න, ජලය, වාතය ආදිය කුපිත වීමෙන් විනාශයට පත්වී ගන යනු ලබන කාල යයි. මෙසේ ලෝකය නැසෙමින් පවත්නා කාලය අන්ත කල්ප ප්‍රමාණයෙන් විස්සකි. සංවර්ථස්ථායී නමින් දක්වා ඇත්තේ විනාශයට පත්වී කල්ප ගණනාවක් සත්වයින්ගේ වාස භූමියකින් තොරව පවත්නා ජන ශූන්‍ය කාලයයි. පෘථිවි තලය වැඩෙමින් පවත්නා කාලය විවර්ත කාලය නමින් දක්වා තිබේ. ලොව සත්ව ප්‍රජාව වැඩී පවත්නා කාලය විවර්තස්ථායි නමින් හඳුන්වා ඇත. ලක්ෂ ගණන් චක්‍රවාටයන්හි සම්පත්තිකර මහා වර්ෂාව පටන් ගත් තැන් සිට ඉර, හඳ ආදිය පහළ වී කෙමෙන් සත්වයන් ලෝකයෙහි හටගැනීමට පටන් ගනී. මෙසේ විවර්තස්ථායි නමින් දැක්වෙන හතරවන භාගයේ ගුණධර්ම නිසා මිනිසාගේ ආයුෂ වැඩි වී සෞභාග්‍ය සම්පත්තිය වැඩෙත්ම සම්මා සම්බුද රජාණන් වහන්සේලා ද පහළ වන්නාහුය. අන්ත කල්පයක කිසිම බුදුරජාණන් වහන්සේ නමක් පහළ නොවන්නාහ. මෙසේ විවර්තස්ථායී කල්පයෙහි එනම් හතර වන භාගයේදී අවුරුදු අසංඛ්‍ය ගණන් ඉක්ම ගිය විට මෛත්‍රී නම් සර්වඥයන් වහන්සේ පහළ වෙති.

සක්විති රජ්ජුරුවෝ ය, දාතරාෂ්ඨ, විරූඨ, විරූපාක්ෂ, වෛශ්‍රවණ යන සතරවරම් මහ රජදරුවෝ ය, ශක්‍ර දිව්‍යරාජයා ප්‍රධාන දෙව් දේවතාවෝ ය, බ්‍රහ්මයෝ ය යන දෙපා ඇති සියළු සත්වයන් අතුරෙන් උතුම් ම, ශ්‍රේෂ්ඨතම පුද්ගලයා බැවින් ඒ

බුදුරජාණන් වහන්සේට දිපදෝත්තම යන නාමය ලැබේ. සාරිපුත්‍ර මහරහතන් වහන්සේගේ ඉල්ලීම පරිදි අනාගතයේ ලෝකයේ පහළ වන මෛත්‍රී බුදුරජාණන් වහන්සේගේ කුශල බලය දක්වන ගෞතම බුදුරජාණන් වහන්සේ මෙසේ වදාළ සේක.

**මහා පුඤ්ඤො මහා පඤ්ඤො**
**මහා ඤාණි මහායසෝ**
**මහබ්බලො මහා ථාමෝ**
**උපපජ්ජිස්සති චක්ඛුමා**
**මහා ගණි සති චෙව**
**දිට්ඨිමා බහුසච්චවා**
**සංඛාතා සබ්බ ධම්මානං**
**ඤාතො දිට්ඨා සුපස්සිනො**
**පරියොගාල්හෝ පරමට්ඨෝ**
**උප්පජ්ජිස්සති සෝ ජිනෝ**

යනුවෙන් වදාළ සේක. තවද, සාරිපුත්‍රයෙනි, ඒ මෛත්‍රී බුදුරජාණන් වහන්සේ සසරදී අතිශය දීර්ඝ කාලයක්, දාන සීල භාවනාදී කුශල් වැඩු උතුමෙකි. එබැවින් උන්වහන්සේගේ මහා කුශල බලයට අංශු මාත්‍රයකින් වත් සමකළ හැකි තව කෙනෙක් නො වන්නේ ය. එතුමෝ මහත් වූ ප්‍රඥා ඇත්තෙකි. ෂඩ් අසාධාරණ ඤාණයෙන් පිරිපුන් උතුමෙකි.

දෙවියන් බඹුන් සහිත සියළු ලෝ වැසියන් පිරිවර කොට ඇති හෙයින් මහා පරිවාර සම්පත්තියෙන් යුක්ත වන්නාහ. කාය බල දහයක් සහ දශවිධ ඥාන බලයකින් සම්පූර්ණ වන හෙයින් අනාවරණ ඤාණයෙන් යුක්ත වන්නාහ.

## මෛත්‍රී බුදුරදුන්ගේ ප්‍රථම විවරණය

අනාගතයෙහි පහළ වන මෛත්‍රී බුදුරජාණන් වහන්සේ, මෙයින් දහසය (සොළොස්) අසංඛ්‍ය කල්ප ලක්ෂයකට පෙර දඹදිව ප්‍රභාවන්ත නමින් සක්විති රජෙක් ව උපත ලදහ. දෙදහසක් කුඩා දිවයින් පිරිවර කොට ඇති සතර මහා ද්වීපයේ ම සත්වයන් පාපයෙන් වලක්වා පංච සීලයෙහි පිහිටුවා එතුමෝ ලෝකය පාලනය කළහ. මේ මහා බෝසත් ප්‍රභාවන්ත රාජයාගේ රාජ්‍ය

පාලනය පංචසීල ප්‍රතිපදාව අනුව විය. එනිසාම ලෝකය පුරා මිනිසා ප්‍රධාන සකල සත්ව ප්‍රජාව අතරම සාමය සමාදානය සෞභාග්‍යය ඇති විය. ඒ කාලයේ මුහුර්ත නම් බුදුරජාණන් වහන්සේ ලොව පහළ වූ සේක. ඒ ප්‍රභාවන්ත සක්විති රජතුමා තිස්හත් යොදුනක් පුරා පැතිරී සිටියාවූ මහා පිරිසත් සමග ඒ බුදුරජාණන් වහන්සේ වෙත ගොස් සිවුපසයෙන් උපස්ථාන කොට මහ දන් පවත්වා අසිරිමත් සැදැහැසිත් ඇත්තේ, සත්රුවන් ආදිය ද පුදා පැවිද්දට පත් වූ හෙයින් රතන තෙරණුවෝ ය යන නමින් මේ බෝසතාණන් වහන්සේ ප්‍රසිද්ධ විය. උන්වහන්සේ ද නියත විවරණ ලබන උතුමකු ළඟ තිබිය යුතු අෂ්ට ධර්ම වලින් පරිපූර්ණව සිටියහ. රතන භික්ෂුවගේ උදාර ගුණයන් ගැනත් මහා පුණ්‍යවන්ත ගුණයන් ගැනත් ඒ මහුර්ත බුදරජාණන් වහන්සේ මහා සංඝයාට පැහැදිලි කර දී මෙසේ වදාළ සේක. මහණෙනි, අප ඉදිරියෙහි සිටින මේ රතන භික්ෂුව දෙස බලන්න. මෙතෙමේ එසේ මෙසේ පින් ඇති කෙනෙක් නොවේ. මෙයින් දහසය අසංඛ්‍ය කල්ප ලක්ෂයකින් මත්තෙහි මේ රතන භික්ෂුව මෛත්‍රී නාමයෙන් ලොවුතුරා බුද්ධ රාජ්‍යයට පත් වන්නේය.

ඒ මෛත්‍රී බුදුරජාණන් වහන්සේට කේතුමතී නමින් රාජධානියක් වාසස්ථාන වෙයි. බ්‍රහ්මවතී නම් මහා පින් ඇති දේවියක් මව් වන්නීය. සංඛ නම් චක්‍රවර්ති රජ්ජුරුවන්ගේ සුබ්‍රහ්ම නමැති පුරෝහිත බ්‍රාහ්මණයා පියා වනනේය. අසෝක ය, බ්‍රහ්මදේව ය. යන මහා ඍද්ධිමත් ශ්‍රාවකයන් වහන්සේලා දෙනම අගසව් වන්නාහ. සීහ නම් භික්ෂුතෙමේ උපස්ථායක තෙරුන් වන්නේය. පදුමා ය, සුමනා ය යන භික්ෂුණීන් දෙනම අග්‍රශ්‍රාවිකාවෝ වෙති. සුධර්ම ය, සංඝනය යන මහ සිටුවරු දෙපළ ප්‍රමුඛ දායක දෙපළ වන්නාහු ය. නාරුක ජය ශ්‍රී මහා බෝධිය වන්නේ ය. ඒ බුදුරජාණන් වහන්සේගේ බුද්ධ ශරීරය අසූ අට රියන් වෙති. රශ්මි ධාරාව පස්විසි යොදුන් තැන පැතිර පවතින්නේ යැයි. මේ රතන භික්ෂුව අනාගතයෙහි බුදු බවට පත්වන, උත්තමයාණන් කෙනෙක් බව පැහැදිලි කරමින් ඒ මුහුර්ත බුදුරජාණන් වහන්සේ ප්‍රථම නියත විවරණය දී වදාළ සේක.

ඒ සම්මා සම්බුදු රජාණන් වහන්සේගේ මේ ප්‍රකාශනයෙන් පසු දෙවියන් සහිත ලෝකයා විසින් පුදන ලද මෛත්‍රී බෝසතාණන් වහන්සේ බුදුවීම සඳහා අවශ්‍ය බුද්ධකාරක ධර්ම කවරහු දැයි මෙනෙහි කළේ ය. එවිට ඒ රතන භික්ෂුව නමින් සිටි

මෙතේ බෝසතුන්ට, මේ බුද්ධකාරක ධර්ම සිතට පහළ විය.

**දානං සීලඤ්ච නෙක්ඛම්මං - පඤ්ඤා විරියේන පඤ්චමං**
**ඛන්ති සච්චමධිට්ඨානං - මෙත්තුපෙක්ඛාතිමේ දස**

දාන, සීල, නෛෂ්ක්‍රම්‍ය ප්‍රඥා, වීර්ය, ක්ෂාන්ති, සත්‍ය, අධිෂ්ඨාන, මෛත්‍රී, උපෙක්ෂා යන මේ දශ පාරමී ධර්මයන් දින එකී ගුණ සොළසාංඛ්‍ය කල්ප ලක්ෂයක් මුළුල්ලේ ම ආත්මභාවයෙන් ආත්මභාවයට පුරුදු කරගෙන ආවේ ය. ඒ සෑම පාරමිතාවක් ම පාරමිතා, උප පාරමිතා, පාරමාර්ථ පාරමිතා වශයෙන් සම්පූර්ණ කළ සේක.

## <u>මෛත්‍රී උපත</u>

මෙසේ පෙරුම්දම් පුරමින් අතිශය දීර්ඝතම කාලයක් පුරා පැමිණි එදා රතන නමින් සිටිය බෝසතාණන් වහන්සේ, අපගේ ගෞතම බුදුරජාණන් වහන්සේ ලෝකයෙහි පහළ වූ කාලයෙහි දෙව්ලොවින් චුතව සැදැත් නුවරින් තුන් යොදුනක් පමණ ඈතින් පිහිටි සංකස්ස නුවර ගෘහපති මහාසාල බ්‍රාහ්මණ කුලයකට අයත්, සිරිවඩ්ඪන මහ කෙළෙඹියාණන්ගේ පුතෙක් ව උපත ලද්දේ ය. මෑණියෝ භාද්‍රාවතී නම් එවැනි ම මහාසාල බ්‍රාහ්මණ කුලයකට අයත් කුමරියක වූවා ය. ත්‍රිවේදයෙහි පාර ප්‍රප්ත වූ මේ බෝසත් ආර්ය මෛත්‍රෙය කුමරා සරණබන්ධනයට පත්ව ශ්‍රී සම්පත් විඳිමින් වෙසෙන කාලයෙහි අප බුදුරජාණන් වහන්සේ බුද්ධත්වයෙන් දස වැනි වස් කාලය දෙව්ලොව වස් වසා මාතෘ දිව්‍ය රාජයා ප්‍රමුඛ කෙල ලක්ෂ ගණනක් දිව්‍ය බ්‍රහ්මයන්ට අභිධර්ම දේශනාව පවත්වා සංකස්ස නුවරට වැඩි සේක. ඒ දිනවල බුදුරජාණන් වහන්සේ ලද දේවාවරෝහන පූජාවෙන් අපරිමිත සතුටට පත් මේ බෝසත් කුමරුවා මහ පිරිසත් සමග පැමිණ බුදුරදුන් වෙතින් මහණකම ලැබීය. ආර්ය මෛත්‍රෙය නමින් උන්වහන්සේ හදුන්වන ලදහ පසු කලෙක මේ බෝසතාණන් වහන්සේ ලද මහඟු වස්ත්‍ර යුගලයක් රැගෙන විත් එකක් බුදුරජාණන් වහන්සේ වැඩ සිටින ගන්ධකුටයෙහි වියනක් කොට බැඳ අනික් වස්ත්‍රය ක්‍රමවත්ව කපා වියන කෙළවර රැළි යොදා බිමට වැටෙන සේ එල්වූහ.

## මෛත්‍රී බෝසතුන්ගේ අවසාන නියත විවරණය

මෙසේ පුදා බුදුරදුන් ඉදිරිපිට උක්කුටියෙන් හිඳ බුදුන් වහන්සේ දෙස බලාගෙනම අනිමිස ලෝචන පූජාවක් ද කළහ. එහි රැස්වූ මහා සංඝයාට භාග්‍යවතුන් වහන්සේ වදාරණ සේක් මහණෙනි, මේ උතුම් වූ වස්ත්‍ර යුගලයකින් බුදුන් පුදා මා දෙස බලාගෙන සමාධිගතව සිටින මේ භික්ෂුන් වහන්සේ දෙස බලන්න. මේ උතුම් ගුණැති මාගේ පුත්‍ර ආර්ය මෛත්‍රෙය භික්ෂු තෙමේ මේ මහා භද්‍ර කල්පයෙහි ම මීළඟට බුදුවන ශ්‍රේෂ්ඨතම උත්තමයා ය. එසමයෙහි මේ බරනැස් නුවර කේතුමති නම් රාජධානියක් වෙයි. එහි සංඛ නම් සක්විති රජෙකි. ඒ සක්විති රජුගේ පුරෝහිත සුබ්‍රහ්ම බ්‍රාහ්මණයා මේ මෛත්‍රීය බුදුරදුන්ගේ පියාණන් වන්නේය. බ්‍රහ්මවතී බ්‍රාහ්මණ මාතාව මව වන්නීය. නා රුක බෝ රුක වන්නේ ය. යැයි වදාරමින් මෛත්‍රෙය මහා බෝසතාණන් වහන්සේට අවසාන නියත විවරණය දී වදාළ සේක.

ඒ ආර්ය මෛත්‍රෙය නමින් නියත විවරණය ලද මහ බෝසතාණන් වහන්සේ දැන් තුසිත දෙව් ලොව උපත ලබා ඇත.

**මෙත්තෙය්‍ය නාමෙන බුද්ධෝ භවිත්වා**
**නිබ්බානගාමිං දෙසේති ධම්මං**
**වාසෙති සෝදානි තුසිතම්හි ලෝකේ**
**වන්දාමහං තං වර බෝධිසත්තං**

මෛත්‍රී නාමයෙන් බුදු බවට පත්ව සත්වයන් නිවන් මගට පමුණුවන්නා වූ ඒ මහා බෝධිසත්වයන් වහන්සේ දැන් තුසිත දිව්‍යලෝකයෙහි වෙසෙති. ඒ මෛත්‍රී බෝසතුන්ට මාගේ නමස්කාරය වේවා.!

## කේතුමතී රාජධානිය

අනාගතයෙහි ලොව පහළ වන ඒ මෙතේ බුදුන්ගේ උපත සිදුවන කේතුමතී රාජධානිය දිගින් දොළොස් යොදුනකි. පළලින් සත් යොදුනකි. එකල එහි උපත ලබන මහා පින් ඇති විවිධාකාර දාන උගත්කම් වලින් පිරිපුන් ජනී ජනයෝ අතිශයින් ම නිරෝගීහු වෙති. දෙමහල්, පස් මහල්, සත් මහල් ඈ ප්‍රාසාදයෙන්ගෙන් කේතුමතී රාජධානිය අලංකාර වන්නේ ය. කුශල ධර්මයෙහි හා

රාජ ධර්මයෙහි නියැලුණු රජදරුවන් අමාත්‍යාදීන් විසින් ආරක්ෂා කරන බැවින් අතිශයින් ම සාමකාමී වන්නේ ය. කිසිම සත්වයෙකු විසින් ජයගත නොහැකි කෙළෙස් අඩු පින් වැඩි ස්ත්‍රී පුරුෂයන්ගෙන් ගැවසීගත් කේතුමතී රාජධානිය මිනිස් ලොව මවන ලද දෙව්ලොවක් හා සමාන වන්නේය. අතිශයින් ගුණදායී ධාන්‍ය වර්ග, බෝග වර්ග, සහ පළතුරු වර්ගයන්ගෙන් පිරී ඉතිරී යන වෘක්ෂලතාවෝය. කිසිවෙක් මස් මාංශ අනුභව නොකරන්නාහ. එවැනි සිරිතක් ද ඔවුහු නොදන්නාහ. ප්‍රාණඝාතය, අදත්තාදානය, කාමමිච්ඡාචාරය, මුසාවාදය සහ සුරාව යන මේ පංච දුෂ්චරිතයන් පිළිබඳ කිසිදු දැනගැනීමක්වත් ඒ මෛත්‍රී බුදුන් පහළ වන කාල පරිච්ඡේදයේ වෙසෙන මිනිස්සු නොදත්නාහු ය. පස් පව් දශ අකුශල්වලින් සහමුලින්ම වැලකුණෝ වෙති. මෙකී ගුණ දම් නිසා ම අචේතනික සචේතනික කිසි වස්තුවකටත් කිසිවකුටත් විපතක් - විනාශයක් නැත. සෞම්‍ය දේශගුණයන් ම පවතින්නේ ය. සියළු ආහාර පාන දිව්‍යමය අමෘතය සේ ඕජෝ ගුණයෙන් යුක්ත හෙයින් මනුෂ්‍යයෝ දෙවියන් දෙවඟණන්සේ බබළති.

ලෙඩක් දුකක් පිළිබඳව ආරංචියක්වත් නැත. මිනිසුන් තුළ ද කරුණා මෛත්‍රී ගුණ ම දියුණු ලෙස පවතී. ඔවුන් තුළ ඊර්ෂ්‍යා ක්‍රෝධාදියක් නැත. පතාගෙන ආ සසර මහා පින් ඇති සත්වයෝ ම ම මේ මෛත්‍රී බුදුරදුන් උපදින දවස ලොව උපත ලැබීම එයට හේතුව යි. මෙවන් අයුරින් සෞභාග්‍ය සම්පන්න සමයකදී කේතුමතී රාජධානියෙහි ඒ මෛත්‍රී බෝසතුන් උපත ලබන බව සැලකිය යුතු ය.

මේ බුද්ධ ශාසනය කාලාන්තරයක් ගතවන විට අධර්මය බහුල වීම නිසා පිරිහී යන්නේ ය. එම ශාසන විනාශයට හේතු හතරකි.

**රත්තඤ්ඤු මහත්තතා**
**වේපුල්ල මහත්තතා**
**ලාභග්ග මහත්තතා**
**බාහුසච්ච මහත්තතා**

රත්තඤ්ඤු මහත්තතා යනු කලාන්තරයක් ගතවීමෙන් අනිත්‍ය ස්වභාවය සනාථ කරවමින් ශාසනය ද අභාවයට යාම යි. බුදු දහම ලෝකයේ විවිධ රට රාජ්‍යවල පැතිරීයාම නිසා ඒ ඒ මිනිසුන් අතර පවතින අනිකුත් ආගම් - ධර්ම - මති මතාන්තර සහ දේව විශ්වාසාදිය සමග මිශ්‍ර වීමෙන් පිරිසිදු බුදු දහම කුමක් ද? යන්න අනාගතයෙහි ඇතිවන ජනයාට දැන ගත නොහැකි වනු ඇත. මේ අනුව ලෝකයේ පවතින අනිකුත් දෘෂ්ටීන් විශ්වාසයන් අතරට වැටීමෙන් පිරිසිදු බුදු දහම මැකී යනු ඇත. එය වේපුල්ල මහත්තතාවය නිසා ඇතිවන විපත යි.

ලාභග්ග මහත්තතාවය නම් වෙහෙර විහාරස්ථානවලට - සංඝයාට අසීමිත ලෙස ධනය ගලා එන්නට වීම නිසා පිරිසිදු පැවිදි බව අමතක වීමෙන් සිදුවන විපතයි. එබැවින් මාගේ ශ්‍රාවකවරු ධනය පොදුවේ පිළිගෙන බෙදා හදා ගත යුතුය. පෞද්ගලිකව ධනය නො පිළිගත යුතු ය. සාංඝික ක්‍රමය අනුගමනය කළ යුතුය, යන්න බුදුරදුන්ගේ අනුශාසනාව ය. බාහුසච්ච මහත්තතාවය නමින් දක්වා ඇත්තේ, ශ්‍රාවක භික්ෂු සංඝයා අනාගතයේ දී ලෝකයෙහි පවතින, ඇතිවන විවිධ ශබ්ද ශාස්ත්‍ර කර්මාන්ත ශිල්ප විද්‍යාදියට ඇබ්බැහි වී, මේ පිරිසිදු තථගත ධර්මය සුළු කොට සලකන වගයි. එය ද ශාසන පරිහානියට තදින් ම බලපානු ඇත. මහණෙනි, මෙසේ අනාගතයෙහි දී ලෝකයේ සැමදා පවත්වාගෙන ආවාවූ පංචසීල ප්‍රතිපදාව අනාගත මනුෂ්‍යයෝ කඩකරන්නාහු ය. ප්‍රාණඝාතාදී ඒ බරපතල අකුශල ධර්මයන්ට ඇබ්බැහි වූ ඔවුහු, ශාසන අන්තර්ධානයෙන් පසු අකුශල ධර්මයන්ට අබ්බැහි වූ ඔවුහු, ශාසන අන්තර්ධානයෙන් පසු අකුශලයට ම පාපයට ම ඇබ්බැහි වෙති.

මෑණියෝ ය, කුඩා මෑණියෝ ය, නැගණියෝ ය, දියණියෝ ය, සහෝදරයෝ ය, මයිලණුවෝ ය, පියාණෝ ය ආදී වශයෙන් නොසලකා ඔවුනොවුන් කාම සංසර්ගයෙහි යෙදෙන්නාහු ය. වස්තුව කෙරෙහි අසමාන ආශාවක් ඇති කර ගනිති. ස්ත්‍රී පුරුෂයන් වශයෙන් ඔවුනොවුන් දුටු විගස ම කාමරාග සිත් ම පහළ කරගන්නාහ. මවු පිය ගුණ නොසලකා හරින අතර වැඩිහිටි ගෞරවය අත හැර දමති. ගුණදම් රකින, පංච සීලයෙන් එක සිල්පදයක්වත් රකින කෙනෙකු සොයා ගැනීම අතිශයින් ම දුර්ලභ වන්නාහ. පස් පවෙහි ඇලී ගැලී විසීම, අනාගතයේ පහළ වන අධර්මිෂ්ඨ ජන සමාජය, උසස් කොට සලකනු ඇත. මෙසේ

යුතුකම් නොසලකන අයුක්තියට ම නිතර කැමති පාප ක්‍රියාවන්හි නිරත මනුෂ්‍යයන් වැඩිවීම නිසා මිනිසාගේ අයුෂය අනුක්‍රමයෙන් දස වසරින් දස වසර අඩුවිගෙන අඩුවීගෙන ගොස් අවසානයෙහි මිනිසාගේ පරම ආයුෂ දස වසර දක්වා පහත බසින්නේ ය.

එකල හත් අට වියේ දැරියන් ආවාහ - විවාහ කර දෙති. මේ කාලය වන විට සියළු රසයෝ අන්තර්ධාන වෙති. ඇල් වී බඳු අග්‍රරසයෙන් යුත් ධාන්‍ය වර්ග අතුරුදහන් වෙයි. කඩල වර්ග කුරක්කන් බඳු ධාන්‍ය වර්ගයෝ අග්‍ර භෝජනය වන්නාහ. කුසලය යන නාම මාත්‍රය පවා අසන්නට නො ලැබෙන්නේ ය. එකල මිනිස්සු අසවලා මව මරණ ලද්දේ ය, පියා මරණ ලද්දේ ය, යැයි තව තවත් බිහිසුණු දේ කරන්නාහ. ඒ අපරාධකාරයා ම වීරයෙක් කොට ඔහුට ම ගරුසරු දක්වන්නාහුය. මිනිස්සු තිරිසනුන් මෙන් ඥාති සම්බන්ධකම් නොතකා කාම සේවනය කරන්නාහු ය. සතුන් මරා මස් කෑම බහුලව කරන්නේ ය. මරාගෙන කනු පිණිස සතුන් ඇති කරන්නාහු ය. ක්‍රෝධය, කෝපය, වෛරය ම රජ කරන්නේ ය. රටවැසියෝ පාලකයන් රවටන්නාහුය. පාලකයෝ රටවැසියන් රවටන්නාහුය. සියල්ලෝම ආත්මාර්ථය ම තකා ක්‍රියා කරන්නාහු ය. බොරුව තම එකම වස්තුව කොට සලකන්නාහු ය.

දෙවියන්ගේ බැල්ම නොලැබී යන්නේ ය.

ඒ පාපකාරී අනාගතයෙහි ත්‍රිවිධඅන්තකල්ප නොහොත් අති දුෂ්කර කාලපර්ච්ඡේද තුනක් වෙති. අනාගතයෙහි උපදින ස්ත්‍රී පුරුෂයින්ගේ අධික ආශාව, රාගය නිසා දුර්භික්ෂ අන්තඃකල්පය ඇති වෙයි. මෝහය හෙවත් මුලාව වැඩිවීම නිසා රෝග අන්තඃකල්පය - රෝග බහුල කාලය වන්නේ ය. අනාගතයෙහි ඇතිවන ස්ත්‍රී පුරුෂයන්ගේ ද්වේශය වැඩිවීම නිසා ශස්ත්‍ර අන්තකල්පය නොහොත් ඔවුනොවුන් කපා කොට මරාගන්නා කාලපර්ච්ඡේදය වන්නේ ය. දුර්භික්ෂ කාලයෙහි ආහාර පාන නොමැතිව අපමණ සත්වයෝ මැරෙන්නාහ. නිසි කලට නිසි පරිදි වැසි නොලැබීම නිසා ගහ කොළ වියළී ගොස් මල් ගෙඩි ආදිය ද විනාශවී යයි. ඒවායෙහි ඕජස් - විටමින් නියම ගුණය ද නැති වන්නේය. මේ කාලයෙහි මැරෙණ සත්වයෝ ආහාර අශාවෙන් ම මැරෙන නිසා ප්‍රේත ලෝකයෙහි ම උපදින්නාහ. විවිධ රෝගාබාධයන් නිසා දුක්විඳ රෝගාන්තඃ කල්පයෙහි මැරෙණ

සත්වයෝ අහෝ මෙබඳු රෝග නම් තව කෙනකුට නොවැළඳේවා යැයි සිතන නිසා ඔවුන් මෙත් සිතින් මැරී ගොස් දෙව් ලොව උපදින්නාහු ය.

ඊර්ෂ්‍යාව, ක්‍රෝධය නිසා ඔවුනොවුන් ඇනකොටා ගෙන ගහබැණ ගෙන ගෙවල් දොරවල් ගිනි තියාගෙන අඬදබර වලින් ම ගෙවන කාල පරිච්ඡේදය ශස්ත්‍රාන්තඃකල්පය නමින් දක්වා ඇත. මෙම කාලයෙහි සත්වයෝ ඔවුනොවුන් කෙරෙහි තද වෛරයෙන් ම මියයන නිසා නරකයෙහි උපත ලබන්නෝය. මෙම කල්ප තුනෙන් අනාගතයෙහි ඇතිවන්නේ ශස්ත්‍රාන්තඃකල්පය බව සැලකිය යුතුයි. එනම්, මෙයින් තුන් වැන්නය.

## <u>මෘගසංවර්ෂාව</u>

මේ අතර මෘගසංවර්ෂාව නම් කල්පාන්ත වැස්ස ද පටන් ගන්නේ ය. එයින් තෙමෙන සත්වයෝ ඔවුනොවුන් කෙරෙහි තද බද්ධ වෛරයක් පහළ කරගෙන ඕකා අල්වාගනුව, කපව්, කොටව් මරව් යයි. මිනිසෙක් මිනිසෙකු දුටු විට කෑගසන්නේ ය. ස්ත්‍රියක් ස්ත්‍රියක දැක කෑගසන්නීය. අතට ගත් දෙය කවරක් වුවත් එය ආයුධයක් බවට පත් වන්නේ ය. මෙසේ ඔවුනොවුන් මරාගන්නාහ. යක්ෂ ප්‍රේත බැල්ම බහුලව පවත්නාහ. එකෙකුට අනෙකකු දුටු විට ඔහු - ඇය මරණු කැමැත්ත ම පහළ වන්නේ ය. පාපයේ බරපතලකම එතරම්ම වැඩිය.

මේ දුක්ඛිත පාපකාරී තත්ත්වය දුටු නුවනැත්තෝ අතිශය ටික දෙනෙක්ම වෙති. ඔවුන් මෙසේ සිතන්නාහ. අහෝ ලෝක විනාශය පැමිණියේ ය. දෙදෙනකුට එකතැන ජීවත් විය නොහැකි ය. එකෙකුට අනෙකා පෙනෙන්නේ මරා දැමිය යුතු - මරාගෙන කෑ යුතු සතකු හැටියට ය. යැයි ස්ත්‍රී පුරුෂයන් ඔවුනොවුන් මරාගනු දැක වහ වහා දෙ තුන් මසකට සෑහෙන ආහාර පාන සපයාගෙන හුදෙකාලාව ම ගස් අතරට හෝ පර්වත ගුහාවකට ගොස් මාස ගණන් සැඟවී ගතකරන්නාහ. ඒ මෘගසං වර්ෂාවෙන් ගැලවෙනු පිණිස යි.

එසේ බුද්ධිමත්ව කල්පනා කරන්නෝ ලක්ෂයකට දෙතුන් දෙනෙකුට වඩා නොවන්නාහුය. අන් සියල්ලෝම ඔවුනොවුන් මරාගෙන විනාශ වෙති. මෙසේ මාස කිහිපයකින් පසු ගල් ගුහාවලින් නික්ම අවුත් කලාතුරකින් ඉතුරු වූ ඒ දෙතුන් දෙනා

සිදුවී ඇති විපත ගැන කතාකොට පාපයේ වැඩිවීම නිසා මනුෂ්‍යයෝ විනාශ වූවෝය. සිතාමතා කටයුතු කිරීම නිසා අපි ටික දෙනා ඉතිරි විය. දැන් අපි සියළු පාපයන් දුරු කරමු වැඩිහිටි මවුපිය ගෞරවය ඇතිකර ගනිමු. ගුණදම් වඩමු යැයි කථිකා කොටගෙන ප්‍රාණඝාතයෙන් වලකින්නෝය. සොරකමෙන් වලකින්නෝ ය. වැරදි හැසිරීමෙන් වලකින්නෝ ය. පරුෂ වචනයෙන් පාපකාරී නිසරු කතාවෙන් වලකින්නෝ ය. අධික ලෝභයෙන් අධික ද්වේෂයෙන් විපරිත දෘෂ්ටියෙන් වලකින්නෝය. දස කුසල් සමාදන් වන්නාහ. විෂම ලෝභය දුරු කරන්නාහ. මෙත් සිතින් වාසය කරන්නාහ. පණ ඇති කිසිවකුටත් හිනයකින් පවා විපතක් නොසිතන්නාහ. දයාව පතුරුවන්නාහ. දැහැමි ජීවිත ආරම්භ කරන්නාහ. කුරා කුහුඹුවකුට වුවද විපතක් නොකරන්නාහ.

මෙම ස්වල්ප දෙනා අර උතුම් ගුණ වඩන්නට පටන්ගත් කල්හි ඔවුන්ගේ ආයුෂ දස වසරින් විසි අවුරුද්දකට දික්වෙයි. ඉහත කී ගුණධර්ම වඩ වඩාත් ස්ත්‍රී පුරුෂයන් අතර දියුණුවන්නට - දියුණුවන්නට ඔවුනගේ ආයුෂ තිස් අවුරුද්ද, හතළිස් අවුරුද්ද, පනස් අවුරුද්ද බැගින් වැඩිවෙමින් දෙසීයක් දක්වා අවුරුදු ආයුෂ වර්ධනය වන්නේ ය. කෙමෙන් ජනගණය ද වැඩිවෙයි. ගස් කොළන්වල මල්, එල, කොළ ආදියෙහි ශරීරයට හිතකර ඕජස් (විටමින්) ගුණ අධික වන්නේ ය. අතිශය පෝෂ්‍යදායි ආහාර වර්ග ටිකෙන් ටික වැඩිවන්නට පටන් ගන්නේය. අතිශය හිතකර දේශගුණයක් පහළ වන්නේය.

මෙසේ මනුෂ්‍යයෝ තව තවත් කුශල කර්ම කරන්නට පටන් ගන්නාහ. කාලාන්තරයක් ගතවන විට කෝටි සංඛ්‍යාත ජන ගහණයක් ඇති වෙති. ඔවුහු දාන සීලාදි ගුණධර්ම ඇත්තෝ ය. හොරු හතුරු බියක්, ක්‍රෝධ කෝප ආදියක් මස් මාංස අනුභයයවක්, මත්පැන් පානයක් ඔවුන් අතර නැත. මේ නිසා ම දිව්‍ය ලෝකවල බ්‍රහ්ම ලෝකවල සිට චුතවන්නෝ ම මේ මිනිස් ලොව උපදිති. මිනිසුන්ගේ ආයුෂ අවුරුදු අනූදහස දක්වා දීර්ඝවන කල්හි බරණැස් නුවර වෙනස් වී උත්පල නගර නමින් ප්‍රකට වන්නේය.

මෙයාකාරයෙන් තවත් කාලයක් ගෙවී යන විට මිනිසාගේ පරමයුෂ අවුරුදු ලක්ෂය වන්නේ ය. ඒ වන විට උත්තල නුවර ඒ නම වෙනස් වී පදුම නගරය නමින් ප්‍රසිද්ධ වන්නේය. මිනිසුන් පිනට දහමට නැඹුරුවූ විට දේශගුණය යහපත් වෙයි. එබඳු

කාලවලදී පෙරකී සේ දිව්‍ය බ්‍රහ්මාදි පින් ඇති ලෝකවලින් චුතවූවෝ ම මේ මිනිස් ලොව පිළිසිඳ ගැනීම ස්වාභාවය යි. එවිට තව තවත් ලෝකය පින්වත් වන්නේම ය.

තව තවත් කල් ගතවන විට පදුනම නගරය මන්දාර නුවර නමින් ප්‍රසිද්ධ වේ. ඒ වන විට දෙව් ලොවටත් වඩා සකලවිධ සම්පත්තියෙන් අනූන දෙවියන් දෙවඟනන් හා සමාන රූප සෝභාවලින් යුක්ත මනුෂ්‍යයෝ ම ඇති වන්නාහු ය. මෙසේ අධික සැප සම්පත් නිසාම කාලාන්තරයක් ගතවන විට කෙමෙන් නැවත මනුෂ්‍යයෝ ගුණධර්ම කෙරෙහි කලින් තිබූ දැඩි සැලකිල්ල අඩුකර ගන්නාහු ය. නැවතත් බොහෝ කලක් ඉක්ම යාමෙන් පරමායුෂ අසූ හාරදහසකට අඩු වන්නේ ය. ඒ කාලය වන විට මන්දාර යන නම වෙනස් වී කේතුමතී නම් රාජධානියක් ඇති වන්නේ ය. ඒ කේතුමතී රාජධානියෙහි සංඛ නම් චක්‍රවර්ති රජ කෙනෙක් පහළ වෙති.

## දසරාජ ධර්ම

ඒ සංඛ චක්‍රවර්ති රජ්ජුරුවන්ට චක්‍ර රත්නය, හස්ති රත්නය, අශ්ව රත්නය, මාණික්‍ය රත්නය, සුත්‍රී රත්නය, ගෘහපති රත්නය, පරිනායක රත්නය යන සප්ත රත්නයක් පහළ වන්නේ ය. සක්දෙව් රජ සේ බබළන ශරීරයක් ඇති වන්නේය. සිරුරෙන් සඳුන් සුවඳ වහනය වන්නේ ය. ඒ එක් සෘද්ධියෙකි. දෙවැන්න මුඛයෙන් මහනෙල් මල් සුවඳ විහිදීම යි. තුන්වැනි සෘද්ධිය නම් දෙවියන් සතර දෙනෙක් සතර දිගින් එතුමා ආරක්ෂා කිරීමය. අතිශය නිරෝගිමත් මෙතුමා දැක කිසිවෙක් කවරදාකවත් සෑහිමකට පත් නොවන්නාහ. එතරම්ම රූප සම්පත්තියෙන් යුක්තය. සිතුනු විගස කවර ලොවකට වුවද අහසට පැනනැගී යා හැකි බලයක් එතුමාට ඇත. මේ සක්විති මහා රාජයාණෝ දසරාජ ධර්මයෙන් ලෝකය පාලනය කරන්නාහ.

**දානං සීලං පරිච්චාගං - අජ්ජවං මද්දවං තපං**
**අක්කෝධෝ අවිහිංසා ච - ඛන්ති ච අවිරෝධතා**

සිල්වත් ගුණවත් උතුමන් කෙරෙහි පවත්වන දානපති බව, සිල්වත්කම, අනාථාධාරාදී පරිත්‍යාග, අවංකබව, මෘදු මොලොක්

ගුණය, තැන්පත් බව, ක්‍රොධ නොකරණ ගතිය, අවිහිංසාව, ඉවසීම හා කා සමගත් ගැටුම් ඇතිකර නොගන්නා බව ඒ දස රාජ ධර්මයෝ වෙති.

ඒ කේතුමතී රාජධානියෙහි සංඛ නම් සක්විති රජුට තමන්ගේ කුශල බලය නිසා දිව්‍යමය මාලිගාවක් පහළවන්නේ ය. විවිධ සත්රුවන් වලින් විසිතුරු වූ මේ මාලිගාවෙහි නොයෙකුත් කොටස් ඇත්තේ ය මේ මාලිගාව දකින සත්වයෝ ඇසිපිය නොහෙළ ඒ දෙස ම බලාසිටින්නෝ ය. එහි දස දෙස පැතිරෙන රශ්මි ඇත්තේය. මහා පිනැතියන්ගේ වාසය සඳහා පහළ වූ බැවින් ශ්‍රේෂ්ඨ වන්නේ ය පිනැතියන්ගේ පුණ්‍ය මහිමය කියා නිම කළ නොහැක්කේ ය. සසරදී පුරණ ලද ගුණධර්මයන්ගේ කුසල විපාක ලබාදීමට පටන්ගත් කල්හි එය කාහටවත් නවතාලිය නොහැක්කේ ම ය.

යටගිය දවස බරණැස් නිවර කුළුපොතු කර්මාන්තයෙන් ජීවත්වන මිනිසෙක් සිටියේ ය. ඔහු හිමාල වනයේ සිට වඩින පසේබුදු කෙනෙකුන් දැක වස් හාරමාසය වසනු පිණිස දිඹුල් ලීයෙන් සහ උණ ලී වලින් කුටියක් තනා මැටි ගසා කොළ සෙවිලි කොට වස් සමාදන් කරවීය. වස් කාලය තුළ සිව්පසයෙන් උපස්ථාන කළේය.

ඒ කුසල කර්මය නිසා ඔහු මරණින් පසු තව්තිසා භවනයෙහි ඉපිද තුන්කෝටි සැටලක්ෂයක් අවුරුදු එහි දිව්‍ය සම්පත් වින්දේ ය. එයින් චුතව නිර්මානරතී දෙව් ලොව ඉපිද දෙසීය තිස්කෝටි හතළිස් ලක්ෂයක් අවුරුදු දිවසැපත් විඳ පරනිම්මිත වසවර්ති දිව්‍ය ලෝකයෙහි උපන්නේය. එම දිව්‍යලෝකයෙහි අවුරුදු නමසිය විසිඑක්කෝටි හැට ලක්ෂයක් දිව ඉසුරු වළඳා ඉන්පසු සංඛ නමින් කේතුමතී නුවර උපත ලැබ සක්විති රජෙක් බවට පත්විය.

## ත්‍රිවිධ කෝලාහල

මෙසේ කල් ගෙවත්ම මෛත්‍රී මහ බෝසතාණන් වහන්සේ තුසිත දෙව්ලොව වෙසෙමින් දෙවියන්ට වාරයක් පාසා බණ කියති. මේ අතර මිනිසුන්ගේ ආයුෂ අසූදහසක් වන කල්හි බුද්ධ කෝලාහලයක් හට ගන්නේ ය. බුද්ධ කෝලාහලය නම් බුදු කෙනෙකු පහළවීමට පෙර මෙසේ උතුමෙක් ඇති වන්නාහ යි

ලෝකයේ ඇතිවන කැළඹීම යි.

ලෝකයෙහි කල්ප කොලාහලය, බුද්ධ කෝලාහලය, චක්‍රවර්ති කෝලාහලය යැයි කෝලාහල තුනක් කලින් කල ඇතිවෙන්නේය.

කල්ප විනාශයට අවුරුදු දස දහසක් තිබියදී කාමාවචර දේවතා කෙනෙක් අව මගුල් වෙස් ගෙන හිසකෙස් කඩාගෙන හඬමින් කඳුළු පිසදමමින් රක්තවර්ණ වස්ත්‍රයක් හැඳ රතු පාට වස්ත්‍රයක් පොරවා මිනිස් ලොවට බැස තව අවුරුදු දහසකින් කල්ප විනාශය වන්නේ ය. ලෝකය නැසෙන්නේය. මහා සමුද්‍රය වියලී යන්නේ ය මහ පොළව මහමෙර දැවී යයි. එනිසා සත්වයෙනි, මෛත්‍රී වඩව්, කරුණාව, උපේක්ෂාව දියුණු කරව්, මව්පියන්ට උපස්ථාන කරව්, දස අකුසල් වලින් වලකිව් ආදී වශයෙන් මහජනයා මැද කියාගෙන යයි. මෙයින් මහජනයා නෙසන්සුන් බවට පත්වන අතර වැඩි දෙනෙක් ඔය අසත්‍යයකැයි නොපිළිගනිති. ටික දෙනෙක් නම් අවවාදය පිළිගනිති. ඔවුහු ගුණදම් පිරීමට පටන් ගනිති. එය කල්ප කෝලාහලය නම් වන්නේය.

සම්මා සම්බුදු රජාණන් වහන්සේ නමක් ලොව පහළවීමට අවුරුදු දහසකට කලින් ලෝක පාලක දේවතාවෝ තව අවුරුදු දහසකින් බුදු කෙනෙක් පහළවන්නාහ යි මිනිස් පථයට පැමිණ කියාගෙන යන්නාහ. එය බුද්ධ කෝලාහලය නම් වෙයි. සක්විති රජ කෙනෙක් පහළවීමට සියක් අවුරුද්දකට කලින් දේවතාවෝ මිනිස් ලොවට පැමිණ තව සියක් වසරකින් සව් ලෝසත්වයින්ට හිත සුව සලසන්නාවූ සක්විත රජකෙනෙක් පහළවන්නේ ය. යැයි කියාගෙන යන්නාහුය. ඒ චක්‍රවර්ති කෝලාහලය යි.

මේ බුද්ධ කෝලාහල ශබ්දය අසා දෙවියෝ ද එක් තැනකට රැස්ව බුදුවන උතුමා දැනගෙන මිනිස් ලොව ඉපිද බුදු බවට පත්ව සව් සතුන් දුකින් මුදවන මෙන් ඉල්ලා සිටින්නාහු, නිදුකාණන් වහන්ස, ඔබ වහන්සේ දස පාරමිතාවන් පුරන ලද්දේ ශක්‍ර සම්පත්, මාර සම්පත්, බ්‍රහ්ම සම්පත්, චක්‍රවර්ති සම්පත් ප්‍රාර්ථනා කරමින් නොවෙයි. ලොවැස්සන් සංසාර සාගරයෙන් එතර කරවනු පිණිස ම සර්වඥතා ඥානය පතා පෙරුම්දම් පුරණ ලද්දේ ම ය. දැන් ඒ පාරමී ධර්මයෝ සම්පූර්ණයහ. එබැවින් නිදුකාණන් වහන්ස, මේ බුදුවීමට කාලය වන්නේය. යැයි සියලු දෙව් දෙවතාවුන්ට නිසි

පිළිතුරක් නොදී ප්‍රථමයෙන් මෙකී කරුණු පස බලන්නාහු ය.

**කාලං දේසං ච දීපං ච - කුලං මාතරමේව ච**
**ඒතේ පංච විලෝකෙත්වා - උප්පජ්ජන්ති තථාගතා**

මේ බුදුවීමට සුදුසු කාලයදෝ යි පළමු කොට කාල සම්පත්තිය බලනු ඇත. ඉන්පසු කුමන දේශයක, කුමන ද්වීපයක, මහජනතාව ගරුකොට සලකන කුමන කුලයක උපත ලැබිය යුතුදැයි පලන්නාහු ය. පාරමිතා පුරා බුද්ධ මාතාවක් වීමට පින් ඇත්තී කවර දේවියක් ද කියාත් බලන්නේ ය. එසේම මිනිසාගේ පරමායුෂ අවුරුදු ලක්ෂයකට වැඩි නම් එවැනි කාලවල ද බුදුවරු පහළ නොවන්නාහ. හේතුව? මහජනයාට මරණ දුක පිළිබඳව කරුණු අවබෝධ කරවීමට දුෂ්කරවීම යි. ආයුෂ වැඩි කාලවල මිනිසුන්ට ජරා දුක, ව්‍යාධි දුක, මරණ දුක පැහැදිලි කරදීමට අසීරු ය. මහත්වූ සැප සම්පත් වලින් ආඩ්‍යවීම එයට හේතුවයි.

එසේම ලෙඩ රෝග නැත. මැරෙණ කෙනෙක් දක්නට ලැබෙන්නේ ද කලාතුරකිනි. තවද මිනිසාගේ පරමායුෂ අවුරුදු එකසිය විස්සට අඩු කල්හි ද බුදුවරු පහළ නොවන්නාහු ය. එවැනි කාලවල ස්ත්‍රී පුරුෂයෝ උත්සන්න වූ කෙළෙස් ඇත්තෝය. රාග ද්වේෂාදී කෙළෙස් අධික බැවින් දෙන අවවාද නොපිළිගන්නෝය. එබැවින් බුදුවරු පහළ නොවන්නාහ තවද, මෙබදු කාලවල උපදින්නෝ ද තිරිසන් ප්‍රේත - අසුර - අවීචි ආදී සතර අපායයන්ගෙන් මිදී යන්නෝමය. යක්ෂ භූතාදී ආත්මවලින් මදී යන අය මිනිස් ලොව වාසයට සුදුසු නොවෙති. පාය අධික ය. උපන් මිනිසුන් ස්ත්‍රීන් තුළ ද පෙර ආත්මවල යක්ෂ ප්‍රේතාදී ගති සිරිත් එලෙස ම පවතී. එය ලොවට වඩාත් හානිකර ය.

## මෛත්‍රී බෝධිසත්වයෝ

මෛත්‍රී බෝසතාණෝ මෙකී කාරණයන් බලා කේතුමතී රාජධානියෙහි සංඛ නම් සක්විති රජතුමාගේ සුබ්‍රහ්ම නම් පුරෝහිත බ්‍රහ්මණයාගේ පුත්‍රයාණන්ව බ්‍රහ්මවතී දේවිය කුස තුසිත දෙව්ලොවින් චුතව පිළිසිඳ ගන්නාහු ය. එකෙණෙහිම දස දහසක් සක්වලධාතු කම්පා වන්නේ ය. වෙවුලන්නේය. සයාකාරයකින් කම්පිත වන්නේ ය. අපමණවූ ආලෝකයක් පැතිරෙන්නේය. සියලු

ගස් වැල්වල මල් පිපෙනු ඇත. දෙවියන්ගේ සාධුකාර අහසේ රැව් පිළිරැව් දෙන්නේ ය. මේ මොහොතෙහි එක්සිය සතිසක් නිරයන්හි ගිනි එක් මොහොතකට නිවී යනු ඇත. ප්‍රේත ලෝකයෙහි සියලු ප්‍රේතයින්ගේ සාපිපාසා දුක් සංසිඳෙන්නේ ය. තිරිසන් සතුන්හට භයක් නැති වන්නේ ය. සියලු සත්වයන්ගේ රෝග සංසිඳෙන්නේ ය. අශ්වයෝ හේසාරව නාද කරන අතර, හස්තීහු කුඤ්චනාද කරන්නාහ. සිහිල් පවන් හමන්නට පටන් ගන්නා අතර මල්වැසි වසින්නට පටන් ගන්නේ ය. පක්ෂි නාද ප්‍රීති නාද පවත්වන්නාහු ය.

මෙතේ බෝසතාණන් වහන්සේ මව්කුස පිළිසිඳගත්දා පටන්හතළිස් දහසක් වරම් රජදරුවෝ ආරක්ෂා කරන්නාහ. බෝසත් මාතාවන්ට පුරුෂයන් කෙරෙහි රාග චිත්තයක් නූපදින්නේ ය. දොළදුක් ආදී වූ කිසි කාය චිත්ත පීඩාවකින් නොමිරිකී සුඛිතව සතුටු සිතින් බෝධිසත්වයන් ඇතුළු කුස සිටින විට, ජාතිරංග මාණික්‍යයෙන් අමුණන ලද රන් පලස් හූයක් මෙන් බෝධිසත්ව මාතාවෝ කුස තුළ හුන් බෝසතුන් දක්නාහ. බුදුවන ජාතියෙහි බෝසතුන්ගේ අසිරිමත් සිද්ධීන් අතර මේ පළමු වැන්න යි.

බුදුවන බෝසත් උතුමෙක් විසූ මව් ගැබ ධාතු කරඬුවක් හා සමාන වන බැවින් අන් සත්වයකුට එහි විසිය නොහැක්කේ ය. එනිසා බෝසත් මාතාවෝ සත් දවසින් ම කාලක්‍රියා කොට තුසිත භවනයෙහි උපදනාහ. මෛත්‍රී බෝසතාණෝ ඉසිපතන නම් නාග වනෝද්‍යානයේදී සුපිපි නා රුකෙක මලින් ගැවසීගත් අත්තක් දකුණතින් අල්ලා ගෙන මව් බිසව් සිටියදීම උපත ලබන්නාශ. එකෙණෙහිම සුද්ධාවාස බ්‍රහ්ම ලෝකයෙහි මහා බ්‍රහ්මයෝ සතර දෙනෙක් රන්රසු දැලින් බෝසතුන් පිළිගන්නාහ. බෝසතුන් උපදින මේ අවස්ථාවේදී ද පෙර කී පරිදි අසිරිමත් දෙතිස් පෙර නිමිති පහළ වන්නාහ. ඒ මෛත්‍රී බෝසතාණෝ ද සත් පියවරක් ඉදිරියට තබමින්,

**අග්ගෝහමස්මි ලෝකස්ස**
**ජෙට්ඨෝහමස්මි ලෝකස්ස**
**සෙට්ඨෝහමස්මි ලෝකස්ස**
**අයමන්තිමාජාති**
**නත්ථිදානි පුනබ්භවෝ**

යැයි සිංහනාද කරන්නාහ.

මම ලෝකයට අග්‍ර වෙමි
මම ලෝකයට ජ්‍යෙෂ්ඨ වෙමි
මම ලෝකයට ශ්‍රේෂ්ඨ වෙමි
මේ මාගේ අන්තිම උපතයි
නැවත මාගේ උපතක් නැත. යනු එහි අදහසයි.

බ්‍රහ්මවතී බ්‍රාහ්මණ දේවිය මෛත්‍රී බෝසතුන් උපත ලබා දින හතකින් මියගොස් තුසිත භවනයෙහි සුසීම නමින් මහේශාක්‍ය දිව්‍ය පුත්‍රයෙක්ව ජනිත වෙයි. මෛත්‍රී බෝසතුන්ගේ ගිහි නම ''අජිත'' වන්නේ ය. ඒ අජිත කුමාරයන්ට තුන් කාලයට විසීම සඳහා වර්ධමාන ය. සිද්ධාර්ථ ය, චන්දක ය යනුවෙන් සත්මහල් ප්‍රාසාද තුනක් පුණ්‍ය මහිමය පරිදි පහළ වන්නේ ය. අහසින් යා හැකි පුදුම බල ඇති වලාහක නමු ශෛන්ධව අශ්වයෙක් ඒ බෝදතුන්ගේ ගමක් සඳහා පහළ වන්නේ ය. චන්ද්‍රමුඛී නම් පංච කල්‍යාණයෙන් බබළන දෙවඟනක් බඳු කුමරියක් අග මෙහෙසිය වන්නේය. ඒ මහ බෝසතාණන් වහන්සේගේ පුතණුවන් බ්‍රහමවර්ධන කුමරා නම් වන්නේය. ඒ අජිත (මෛත්‍රී) මහ බෝසතාණන් වහන්සේගේ කුශලානුභාවයෙන් සංඛ නම් චක්‍රවර්ති අජ්ජුරුවන් ඇතුළු අවශේෂ සියලු රජදරුවෝ තිදුකාණන් වහන්ස, අපි ඔබ වහන්සේටම මෙහෙ කරුණු කැමැත්තෙමු. යැයි දිවුරුම් දෙන්නාහ. මෛත්‍රී නමින් බුදුවන මේ අජිත නම් මහ බෝසතාණන් වහන්සේ සතර පෙර නිමිති දැක වස්තුකාම ක්ලේෂකාමයන්හි කලකිරී පැවිද්දට සිත් යොමු කොට මහබිනික්මන් කිරීමට සිතත්ම මහා බ්‍රහ්මරාජයා විසින් අටපිරිකර පුදනු ලබයි ඒ ඒ කාලවදී බඹලොව ප්‍රධානත්වය දරණ බ්‍රහ්මරාජයාම බුදුවන මහ බෝසතාණන්ට සිවුරු පිරිකර පුදන්නාහු ය. එය ද ධර්මතාවකි.

එකල්හි අජිත (මෛත්‍රීය) මහ බෝසතාණන් වහන්සේ ප්‍රාසාදයෙන් බැස කෙස්වැටිය කපා අහසට දමා මාලිගාව දොරකඩදී ම මහණ වෙස් ගන්නාහ.

**චතුරාසීති සහස්සානි**
**බ්‍රාහ්මණා වේද පාරගා**
**මෙත්තෙය්‍යස්මිං පබ්බජිතේ**
**පබ්බජිස්සන්ති තේ තදා**

දක්වා ඇති පරිදි අසූහාර දහසක් ත්‍රිවේදයෙහි පාර ප්‍රාප්ත බ්‍රාහ්මණයෝ ද ඒ අනුව පැවිදි වන්නාහු ය. ඉසිදත්තය, පුරාණයය යන බ්‍රාහ්මණ කුමාරවරු දෙදෙනෙක් අසූහාරදහසක උපාසක පිරිසක් සමග ගොස් පැවිදි වන්නෝය. සුමනා නම් මහා පින් ඇති උපාසිකාව අසූහාර දහසක් උපාසිකාවන් සමග ගොස් මෙහෙණි සස්නෙහි මහණ වන්නී ය. මෙසේ අවශේෂ මහා ජනයා ද ලක්ෂ ගණනින් ගොස් පැවිදි වන්නාහු ය. කුලවත් ගුණවත් කාන්තාවෝ ද ලක්ෂ ගණනින් බුද්ධ ශාසනයෙහි පැවිදි වන්නාහ. මේසියල්ලෝ ම මෛත්‍රී බුදුන් දවස නිවන් දැකීමට පතාගෙන ආවෝ වෙති.

## බුදුබවට පත්වීම

ඒ මෛත්‍රී බෝසතාණෝ චන්ද්‍රමුඛි නම් අග මෙහෙසිය විසින් දෙන ලද දිව්‍ය ඕජස් යොදන ලද මීකිරිපිඩු වළඳා නාග ශ්‍රී මහා බෝධිය ළඟට ගොස් ජලිත නම් බමුණකු විසින් පුදන ලද ඊතණ අට මිටක් පිළිගෙන ඒ මත වැඩ හිඳින්නාහු ය. එකෙණෙහි වසවත් මාරයා තමාගේ දිව්‍ය ලෝකයෙහි සිටියදී ම බෝසතුන්ගේ මුහුණ බලා භයින් වෙවුලා යන්නේ ය. ඉන්පසු මේ බෝසතාණන් වහන්සේ රාත්‍රියෙහි ප්‍රථම යාමයෙහි පූර්වේනිවාසානුමස්මෘති ඥානය ද මධ්‍යම යාමයෙහි දිව්‍යා චක්ෂුරභිඥානය ද පශ්චිම යාමෙහි සර්වඥතා ඥානය ද උපදවා දස දහසක් ලෝකධාතුන් කම්පා කරවමින් කෝටි සංඛ්‍යාත දෙව් බඹුන්ගේ සාධුකාර මධ්‍යයෙහි ලොව්තුරා බුදුබවට පත්වන සේක. උන්වහන්සේගේ අසීමිත පුණ්‍ය තේජස නිසා වසවත මරු තම විමනෙහි සිට ම පෙරකී සේ බුදු මුහුණ දැක නිහඬ වන්නේ මය. සොළොසා සංඛ්‍ය කල්ප ලක්ෂයක් පුරා පිරූ පාරමිතා බලය එබඳු ය.

ඒ මෛත්‍රී බුදුරජාණන් වහන්සේ සත්සති යවා දම්සක් පැවතුම් සූත්‍ර දේශනාව පවත්වන දා මනුෂ්‍යයෝ ද දසදහසක් සක්වල දෙවියෝ ද යොදුන් සියයක් ප්‍රමාණයෙහි පැතිර සිටින්නාහ. එදා ම

**දුක්ඛං දුක්ඛසමුප්පාදං**
**දුක්ඛස්ස ච අතික්කමං**
**අරියඤ්චට්ඨංගිකං මග්ගං**
**දුක්ඛුපසමගාමිනං**

යනාදී ක්‍රමයෙන් දක්වන ලද දම්සක් පැවතුම් සූත්‍ර දේශනාව අසා කෙළලක්ෂයක් මනුෂ්‍යයෝ ක්ලේෂ බන්ධනයෙන් භව බන්ධනයෙන් මිදී සතර මග සතර ඵලයට පැමිණ අමාමහ නිවන් දක්නාහු ය. මාර්ග ඵල ලැබ නිවන් දුටු දෙවියෝ මෙතෙකැයි ගණන් නැත්තාහු ය.

මේ ප්‍රථම ධර්ම දේශනාව අසා සංඛ නම් සක්විති රජ්ජුරුවන් හා අති විශාල සේනාවක් බුදුරදුන් වෙත පැමිණ ඒහි භික්ෂු ප්‍රව්‍රජ්‍යාවෙන් මහණ වන්නාහ. සසරදී පුදන ලද අෂ්ඨ පරිෂ්කාර පූජාවෝ ඔවුනට ඒ, සැණෙකින් ලබන අරුම පුදුම එම පැවිද්දට හේතුවන්නාහ. ඉන්පසු ඒ මෛත්‍රීය සර්වඥයන් වහන්සේ ඇසළ පුණු පොහෝදා ඒහි භික්ෂු ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිද්දට පත් සංඛ සක්විති රජතුමන් ප්‍රධාන රහතන් වහන්සේලා සමග ප්‍රථම වස්සාන සමයෙහි වස් ඉටාගන්නා සේක.

## බුදු අසිරිය

තවද, මේ මෛත්‍රී බුදුරජාණන් වහන්සේ සත්වයන් තිසරණ සරණයෙහි පිහිටුවන සේක. ඇතැම් මනුෂ්‍ය යන් පංච සීලයෙහි පිහිටුවන සේක. සමහර අය දස කුශලයෙහි පිහිටුවන සේක. වඩාත් පින් ඇති අය පැවිදි උපසම්පදිවට පත් කරන සේක. ඒ ඒ පින් ඇති උපාසක උපාසිකාවන්ට අපේ ගෞතම බුදුරජාණන් වහන්සේ විශාඛා සිටු දේවියට, අනද මහ තෙරුන් වහන්සේට දුන් වර අට හා සමාන අෂ්ඨ වරයන් දෙන සේක. එකල ඒ මෛත්‍රී බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවක ශ්‍රාවකාවන් වහන්සේලා පොරවන ලද කසාය වස්ත්‍රයෙන්, සඳ - හිරු ආලෝකයට අමතර තුන් වැනි ආලෝකයක් ද ලොව පැතිර යන්නේය. ඒ කාලයෙහි උපදින භික්ෂු, භික්ෂුණී, උපාසක උපාසිකාවෝ ද සසර බොහෝ පින් කෙරෙමින් මෛත්‍රී බුද්ධ ශාසනයේදී නිවන් පැතුවෝ ම වෙති. එනිසා ඔවුහු මහා පුණ්‍යවන්තයෝ මැ යි.

පිරුණු මෛත්‍රී බල ඇති භික්ෂුන් වහන්සේලාගේ සහ භික්ෂුණීන් වහන්සේලාගේ ශරිරයෙහි වැදී හමායන සුළඟ නිසා මහජනයාගේ සියලු ලෙඩ දුක් දුරු වන්නේ ය. ලෝකයේ මිථ්‍යා විශ්වාස නමැති සනාන්ධකාරය දුරුව යන්නේය. ලක්ෂ ගණන් භික්ෂූන් වහන්සේලා ඒ මෙතේ බුදුරදුන් වෙතින් කමටහන් උගෙන වන ගතව බණ භාවනා කොට අමාමහ නිවන් දකින්නාහ. තවද,

මෙතේ බුදුන් දැක නිවන්දක්නට ලබම්වා යැයි පතා පින් කළ සියල්ලෝ ම ඒ මෛත්‍රී බුද්ධ ශාසනයේ දී සසර සයුරින් එතෙර වන්නාහ.

එ මෛත්‍රී සර්වඥයන් වහන්සේ කෙරෙහි පැහැදුනා වූ දෙව් මිනිස්සුන් සතුටින් කුල්මත්ව ක්‍රීඩා කරන්නාහ. ගී කියන්නාහ. ඔල්වර හඬ දෙන්නාහ. සාධු නාද පවත්වන්නාහ. ලක්ෂ ගණන් ධජ පතාක බැබලී බැබලි ලෙල දෙන්නේය. රන්වන් පාටින් බබළන දෙවියන් බඳු ශරීර ඇති මහා පින් ඇති උපාසක උපසිකාවන් අතර ඒ බුදුරජාණන් වහන්සේ වැඩසිටිනා ප්‍රදේශය සඳුන් සුවඳින් නිරන්තරයෙන් ම සුවඳවත් වන්නේය.

ඒ මෛත්‍රී බුදුරජාණන් වහන්සේ ශ්‍රී පාදය බිම තබන කල්හි සැමතැන එකවර පොළොවෙහි ගැටී සිටන්නේ ය. පාදය මැදින් උස්ව නොසිටින්නේය. මෙය උන්වහන්සේගේ සුප්පතිට්ඨිත පාද ලක්ෂණය යි. ඒ තථාගතයන් වහන්සේගේ යටිපතුල්වල දහසක් රේඛා ඇති චක්‍ර සටහන් යුවලක් පිහිටා ඇත්තේ ය. ඒ වටා ස්වස්ථිකය, ශ්‍රී වත්සය, නන්ද්‍යාවර්තය, අවතංසය, ආදි මංගල ලකුණු බොහෝ ගණනක් පිහිටා ඇත්තේය. එය ශ්‍රී පාදයෙහි පිහිටි දෙවන මංගල ලක්ෂණය යි.

ආයතපණ්හි යනු දික් වූ විලුම් ඇති බවයි. සාමාන්‍ය මහජනයාගේ මෙන් දිග විලුම් අත් පතුල් වලින් තෙරව පතුල දෙකට බෙදී භාගයක් ඉදිරියට ඇත්තේය. එය මනා කැටයමෙන් ලියවන ලද්දක් මෙන් ශෝභන ලෙස පිහිටියේ ය. ඒ බුදුරජාණන් වහන්සේගේ අත් පා වල ඇඟිලි මුල මහත්ව අග සිහින්ව ක්‍රමවත් ලෙස පිහිටියේ ය. තවද, උන්වහන්සේගේ අතුල් පතුල් උපන් සැටියේ දරුවකුගේ මෙන් ඉතා මොළොක්ව පිහිටා ඇත. ඒ තථාගතයන් වහන්සේගේ අතේ පයේ ඇඟිලි දක්ෂ කාර්මිකයෙකු විසින් ලියවූ පොලු යොදා කළ කවුළුවක අග් මුල් හා ගැට එක් පෙළට පවත්නාක් මෙන් මසින් වටවී ඇත්තාහ. නො නැමී දෙ දණ පිරිමැදිය හැකි පරිදි දික් වූ අත් පිහිටා ඇත්තේ ය. ශරීරය ඔපවත් කළ රන් මෙන් ස්වර්ණ වර්ණයෙන් බබළන්නේ ය. උන්වහන්සේගේ සම ඉතා සියුම් ය. ශරීරයට දූහුවිලි නො අල්ලන්නේ ය. දකුණට කැරකුණු රෝමකූප ඇත. බුද්ධ ශරීරය ඉතා ඍජු ශරීරයක් වන්නේය. ශරීරයෙහි කොතැනකවත් ඇට නහර පැදී නැත. උසට සම වන මහතින් ද මහතට සම වන උසින් ද යුක්ත වන්නේය. නීල -පීත - ලෝහිත - ඕදාත - මාංජේෂ්ඨ ප්‍රභාෂ්වර

යන රශ්මි මාලාවෝ නිතර ශරීරයෙන් විහිදෙන්නාහ. ශ්‍රී පාද යුග්මය බිම තබත් තබත් ම රන් නෙළුම් පෘථිවි තලයෙන් මතුවන්නේය.

ගෙල රන්කරක් සෙයින් වටව පිහිටා ඇත්තේ ය. කථා කිරීමේදී නහර මතුවීමක් නැත. ඒ තථාගතයන් වහන්සේගේ හනු සම්පූර්ණ බැවින් එක් එක් කහනුවක දත් විස්ස බැගින් දත් සතළිසක් පිහිටා ඇත. සියළු දත් එකිනෙක බැදී පිහිටා ඇත. එනිසා දත් අතර විවර නැත. සිනාසෙන විට සුදු රැස් දහරාවෝ විහිදෙන්නාහ. ඒ මෛත්‍රී බුදුරජාණන් වහන්සේගේ දිව දිග පළල මෘදු මොලොක් වර්ණවත් ය එනිසා ස්වරය මිහිර ය. ඉතා ඉක්මනින් පැහැදිලිව කථා කළ හැකි වන්නේය. ඔප දමන ලද නිල් මැණික් ගුලි දෙකක් සේ බබළන නේත්‍ර යුග්මය පිහිටා ඇත. නළල මැද දකුණට කරකැවුණු ඌර්ණරෝමධාතුව පිහිටියේ ය. තවද, ඒ සර්වඥයන් වහන්සේගේ බුද්ධ ශරීරය අට අසූරියන් උස වන්නේය. දෙපතුලෙහි පටන් දෙ දණ මඩන දක්වා දෙවිසි රියන් උස වන්නේ ය. දෙ දණ මඩළෙහි පටන් නාභිය දක්වා දෙවිසිරියන් වන්නේ ය.

එතැන් පටන් අකු ධාතුව දක්වා දෙවිසි රියන් උස වන්නේය. අකු ධාතුවෙහි පටන් හිස් මුදුන දක්වා දෙවිසි රියන් උස වන්නේය. දකුණු උර මඩලෙහි පටන් වම් උර මඩල දක්වා විසිපස් රියන් වන්නේය. විදුලිය දෙකක් වන් කන්වැල් සඟල සත් රියන් සත් රියන් පමණ වන්නේය. පස් පෑ දිස්නා එකී එකී ඇස් පස් පස් රියන් පමණ වන්නේ ය. ස්වර්ණ පර්වතයක් මත පිහිටියා වූ දේදුණු සඟලක් වැනි සශ්‍රීක වූ ඇහිබැම් සඟල පස් පස් රියන් පමණ වන්නේය. මේ බුද්ධ කාලයෙහි මනුෂ්‍යයෝ ද සැත්තෑ රියන්, පන් සැත්තෑ රියන්, අසූ රියනට ආසන්න උස මහත ඇත්තෝ ම වෙති. මේ මහා පුණ්‍යවන්ත කාල පරිච්ඡේදයෙහි ගස් වැල් ආදිය සතා සිව්පාවෝ ද නිවාස වාසස්ථානයෝ ද මේ පින්වත් මනුෂ්‍යන්ගේ ප්‍රමාණය අනුව අදට වඩා වෙනස් වන්නේය. එය පිනේ මහිමය යි.

ඒ මෛත්‍රී බුදුරදුන්ගේ ඇස් බැම අතර පස් රියන් පමණ වන්නේය. රන් අංකුස හා සමාන උස් වූ නාසිකව සත් රියන් පමණ වන්නේය. බිඹු ඵල දෙකක් හා සමාන වූ අතිරක්ත වූ තොල් සඟල පස්රියන් පමණ වන්නේය. ඉතා සිනිඳු වූ මොළොක් වූ තුනී වූ ඉතා රතු වූ පළල් ජිව්හා ධාතුව දස රියන් පමණ වන්නේය. සිරස් ධාතුව

වටින් පස්විසි රියන් පමණ වන්නේය. එසේම රන් කැටපතක් හා සමාන වූ මුඛ මණ්ඩලය වටින් පස්විසි රියන් පමණ වන්නේ ය. රන් මිහිගු බෙරයක් හා සම වූ ග්‍රීවා ධාතුව සත් රියන් දික් වන්නේය. එකී අතුල් තලය පස් පස් රියන් පමණ වන්නේය. සශ්‍රීක වූ ශ්‍රී පාද දෙක තෙලෙස් රියන් එක් වියත් සයඟුලක් පමණ වන්නේ ය.

මෙසේ ඒ මෛත්‍රී සර්වඥයන් වහන්සේගේ නේත්‍ර යුග්මයෙන් විහිදෙන ආලෝකයෙන් රාත්‍රී කාලයෙහි දොළොස් යොදුනක් ඇතුළත ආලෝකය විහිදෙන්නේ ය. උන් වහන්සේගේ ශරීරයෙන් විසිපස් යොදුනක් ඈතට සඳ එළිය බඳු සෞම්‍ය වූ ආලෝකයක් විහිදෙන්නේ ය. ඒ බුදුරජාණන් වහන්සේ යම් තැනෙක්හි වඩිනා සේක් වී නම්, සිරි පතුල් තැබූ තැබූ තන්හි කලින් කී සේ පිපුණු නෙළුම් මල් පැන නගින්නේ ය. පොළෝ තලේ මතුයෙහි පියුම් මතම උන්වහන්සේ වඩින සේක. එබඳු වූ මහත් වූ පුණ්‍ය සමෘද්ධියෙන් ඒ මෛත්‍රී බුදුරජාණන් වහන්සේ ශෝභා සම්පන්න වන්නේ දහසය අසංඛ්‍ය කල්ප ලක්ෂයක් මුළුල්ලෙහි පිරූ දානාදී සමත්‍රිංසත් පාරමී ධර්මයන්ගේ පුණ්‍ය බලය නිසා ම ය. එහෙයින් සියල්ලෝ ම ඒ මෛත්‍රී තථාගතයන් වහන්සේ දැක අමාමහ නිවන් දැකීමට උත්සාහ කටයුත්තේ මය.

**<u>මෛත්‍රී බුදුන් නොදකින්නෝ</u>**

මෛත්‍රී බුද්ධ කාලය වන විට මිනිසුන්ගේ පරමායුෂ අවුරුදු අසූදහසක් වෙයි. මේ මෛත්‍රී තථාගතයාණෝ ඒ අවුරුදු අසූ දහසම ජීවමානව වැඩ සිටින්නාහ. මේ ගෞතම බුද්ධෝත්පාද කාලයෙහි කුසල් කළ බොහෝ ජනයා මෛත්‍රී බුද්ධ ශාසනය තථාගතයන් වහන්සේ පිරිනිවන් පෑමෙන් පසු ද එක්ලක්ෂ අසූ දහසක් අවුරුදු පවත්නේය.

තවද, ඒ මෛත්‍රී සර්වඥයන් වහන්සේ නොදකින්නෝ කවරහුද යත් මව් මැරුවෝ ද පියා මැරුවෝද ඒ මෛත්‍රී බුදුන් නොදක්නාහු ය. රහතුන් වහන්සේලා මැරුවෝද ඒ මෛත්‍රී බුදුන් නොදක්නාහු ය. ලෝහිතුප්පාදක පාප කර්මය කළෝ ද ඒ මෛත්‍රී බුදුන් නොදක්නාහුය. සංඝ භේදය කළෝ ද ඒ මෛත්‍රී බුදුන් නොදක්නාහුය. දාගැබ් බින්දෝ ද පෙති පිළිම බෝගස් වැනසුවෝද රන් රිදී බුදුපිළිම සොරකම් කළෝ ද ඒ මෛත්‍රී බුදුන් නො

දක්නාහුය.

බණ පොත් විනාශ කළෝ ද සඟසතු දේපළ ගසාකෑවෝ ද ඒ මෛත්‍රී බුදුන් නොදක්නාහු ය. මහණ බමුණන්ට හිරිහැර කළෝද මව්පියන්ට හිංසා පීඩා කළෝද ඒ මෛත්‍රී බුදුන් නොදක්නාහු ය. සිල්වත් ගුණවත් උතුමන්ට බොරු චෝදනා කළෝ ද දන්වැට පුද පඬුරු ගසා කෑවෝ ද ඒ මෛත්‍රී බුදුන් නොදක්න්නාහු ය. මහජන සන්තක දේ අයථා ලෙස පරිහරණය කළෝ ද වන සම්පත් විනාශ කළෝ ද පරිසර දූෂණය කළෝ ද ඒ මෛත්‍රී බුදුන් නොදක්නාහු ය. අලස ලෙස වැඩ කළෝ ද කපටි වංචනිකයෝ ද ඒ මෛත්‍රී බුදුන් නොදක්නාහුය.

මෙලොවක් නැත, පරලොවක් නැත, පිනක්-පවක් නැතැයි කීවෝ ද ඒ මෛත්‍රී බුදුන් නොදක්නාහුය. ප්‍රණඝාත කලෝ ද ඒවාට අනුබල දුනනෝද සොරකම් කළෝ ද සොරකමට අනුබල දුන්නෝ ද අනාචාරයෙහි හැසුරුණෝ ද එයට අනුබල දුනනෝ ද බොරු කීවෝ ද පරුෂ වචන කීවෝද, සම්පප්‍රලාප දෙඩුවෝ ද එකී පාපයන්ට අනුබල දුන්නෝද ඒ මෛත්‍රී බුදුන් නො දක්නාහු ය. මත්පැන් බීවෝ ද මත් පැනට අනුබල දුන්නෝ ද මත් ද්‍රව්‍ය පැතිර වූවෝ ද ඒ මෛත්‍රී බුදුන් නො දක්නාහු ය. විවිධාකාර වු දුකෙළිවල යෙදුනෝ ද එකී පාපයන්ට අනුබල දුන්නෝ ද ඒ මෛත්‍රී බුදන් නොදක්නාහුය. සතුන් මරා මස් කෑවෝ ද එයට අනුබල දුන්නෝ ද ඒ මෛත්‍රී බුදුන් නොදක්නාහු ය. මරණු පිණිස සතුන් ඇති කළෝ ද මැරීමට විකුණනු ලැබුවෝද ඒ මෛත්‍රී බුදුන් නොදක්නාහු ය.

බොරු සාක්ෂි දුන්නෝ ද බොරුවට දිවුරුවෝ ද ඒ මෛත්‍රී බුදුන් නොදකින්නාහු ය. ණය ගෙන ණය නුදුනුනෝ ද ගිනි පොලීකරුවෝ ද ඒ මෛත්‍රී බුදුන් නො දක්නාහු ය. අන්හට ලැබෙන දෙය වැළැක්වුවෝ ද අනුන් නොමග යැවුවෝ ද ඒ මෛත්‍රී බුදුන් නොදක්නාහු ය. නිසි ලෙස මහණදම් නොපුරමින් දුසිල් ජීවිත ගත කලෝ ද පැවිදිව පැවිදිකම්හි නො යෙදුනෝ ද ඒ මෛත්‍රී බුදුන් නො දක්නාහු ය. අල්ලස් ගත්තෝ ද ඒ පාපයට අනුබල දුන්නොද ගේ දෙර ගිනි තැබුවෝද ඒ මෛත්‍රී බුදුන් නොදක්නාහු ය. ගහකොළ භෝග වගාවන් විනාශ කළෝ ද ඒ මෛත්‍රී බුදුන් නොදක්නාහු ය. වස විෂ කැව්වෝ ද හදි හූනියම් කළෝද එකී පාපයන්ට අනුබල දුන්නෝ ද ඒ මෛත්‍රී බුදුන් නොදක්නාහු ය. හොර ජාවාරම් කරුවෝ ද අධික මිලට වෙළහෙලදාම් කළෝද ඒ මෛත්‍රී බුදුන් නොදක්නාහුය. බොරුවෙන් වංචාවෙන් චාටුවෙන්

රජ මැති ඇමතිවරුන් නරදෙටුවන් නොමඟ යැව්වෝ ද නපුරු අවි ආයුධ තැනුවෝ ද එකී පාපයන්ට අනුබල දුන්නෝ ද ඒ මෛත්‍රී බුදුන් නොදක්නාහුය.

අනේකාකාර ක්‍රම උපක්‍රම වලින් රටවැසියාට හිංසා පීඩා පැමිණ වූ රජ මැති ඇමති පාලකයෝ ද වැව් පොකුණු ගංගා ආදී ජලාශයන් අපිරිසිදු කළෝ ද ඒ මෛත්‍රී බුදුන් නොදක්නාහු ය දරුවන් නොමග යැවුවෝ ද යුතුකම් පැහැර හැරියෝ ද ඒ මෛත්‍රී බුදුන් නොදක්නාහුය අධිකව අනුන් පහත් කොට සැලකුවෝ ද මාන්න අධිකව අනුන් පහත් කොට තමන් උසස් ලෙස සැළකුවෝද ඒ මෛත්‍රී බුදුන් නො දක්නාහු ය. අඹුදරුවන් අතරමං කළෝ ද අනුන් බය ගැන්වුවෝද ඒ මෛත්‍රී බුදුන් නොදක්නාහු ය.

ඉහත කී පරිදි අකුශල් කළෝ මෛත්‍රී බුදුන් නො දක්නේ, කවර හෙයින්ද යත් මේ පාපකර්මයන් කිරීම නිසා මරණින් මතු සංජීවය, සංඝාතය, කාලසූත්‍රය, රෞරවය, මහා රෞරවය, තාපය, ප්‍රතාපය අවීචිය යන අට මහ නරකයන්ට වැටී ඔවුහු අනනුත අප්‍රමාණ කාලයක් අපමණ දුක් විඳින්නාහුය. ඒ මෛත්‍රී සර්වඥයන් වහන්සේගේ කාලය වන විට ද මෙකී නොකී පවුකම් කළෝ ඒ ඒ අපායයන්හි ම වෙසෙන බැවින් අහෝ ඔවුන්ට ඒ මෛත්‍රී බුදුරජාණන් වහන්සේ නොදැකිය හැකි වන්නාහුමය.

## මෙතේ බුදුන් දකින්නෝ

තවද, ඒ මෛත්‍රීය සම්මා සම්බුදු රජාණන් වහන්සේ දකින්නාහු කවරහු ද යත්? පන්සිල් රැක්කාහු ද දස කුසල්වල යෙදුනෝ ද ඒ මෛත්‍රී බුදුන් දැක නිවන් දක්නාහු ය. දාගැබ් කරවුවෝ ද දාතුකරඬු පිදුවෝ ද දාන ශාලා තැනුවෝ ද ඒ මෛත්‍රී බුදුන් දැක නිවන් දක්නාහු ය. වැව් පොකුණු බැන්දෝ ද ඒ දඬු පාලම් තැනුවෝ ද ඒ මෛත්‍රී බුදුන් දැක නිවන් දක්නාහුය. ධර්ම දේශනා කළෝ ද ධර්ම ශ්‍රවණය කළෝ ද

ධර්මය ලියන ලද්දෝ ද ඒ මෛත්‍රී බුද්න් දැක නිවන් දක්නාහු ය. පන්සල් තැනුවෝ ද පාඨශාලා තැනුවෝ ද ගිලන්හල් තැනුවෝ ද අනාථාගාර ඉදි කරවුවෝ ද ඒ මෛත්‍රී බුදුන් දැක නිවන් දක්නාහු ය. ආදර බහුමානයෙන් මහණ දම් පිරුවෝ ද මහජනයා කුශල්හි යෙදවූ පැවිද්දෝ ද ඒ මෛත්‍රී බුදුන් දැක නිවන් දක්නාහුය. ආහාරපාන දන්දුන්නෝ ද ගෙවල් දොරවල් නිවාස තනා දුන්නෝ ද

මෛත්‍රී බුදුන් දැක නිවන් දක්නාහුය. කෙත්වතු පිදුවෝ ද සිවුරු, රෙදිපිළි පිරුවෝ ද මෛත්‍රී බුදුන් දැක නිවන් දක්නාහු ය.

පිළිම ගෙවල් ඉදිකරවූවෝ ද පෙති පිළිම කරවුවෝ ද ඒ මෛත්‍රී බුදුන් දැක නිවන් දක්නාහු ය. බෝධිසත්ව චරිත කතාවන් අඹවන ලද්දෝ ද ඒවා බිතු සිතුවම් කරවුවෝ ද ඒ මෛත්‍රී බුදුන් දැක නිවන් දකින්නාහු ය. ගිලනුන්ට උපස්ථාන කළෝ ද රෝග තුරන් කිරීමට වෙහෙස මහන්සි වුවෝ ද වසංගත රෝග වලක්වා ලූවෝ ද ඒ මෛත්‍රීය බුදුන් දැක නිවන් දකින්නාහුය. සතුනට කරන හිංසා වැලැක්වූවෝද ගිලන් සතුන්ට බේත් හේත් කළෝ ද බන්ධනගත සතුන් මුදා හැරියෝ ද ඒ මෛත්‍රී බුදුන් දැක නිවන් දකින්නාහු ය.

තවද, මවුපියන්ට උපස්ථාන කළෝද ගුරුවරාදීන්ට සංග්‍රහ කළෝද ඒ මෛත්‍රී බුදුන් දැක නිවන් දක්නාහුය. තුණුරුවන් උදෙසා උඩුවියන් පාවාඩ පිදුවෝ ද ශබ්ද පූජා පැවැත්වූවෝ ද ඒ මෛත්‍රී බුදුන් දැක නිවන් දක්නාහු ය. සුවඳ දුම් පිදුවෝ ද පහන් ගෙවල් තැනුවෝ ද ඒ මෛත්‍රී බුදුන් දැක නිවන් දක්නාහු ය. බණ අසන්නට හඬගෑවෝ ද බණ දෙසන කල සාධුකාර දුන් නෝ ද ඒ මෛත්‍රී බුදුන් දැක නිවන් දක්නාහු ය. මහජන සුභසෙත සැලසූ රජ මැති ඇමති සිටු ආදී නරදෙටුවෝ ද දැහැමින් රට කරවූ නරවිරුවෝ ද වැසියන් නොතලා අයබදු ගත් රජදරුවෝ ද ඒ මෛත්‍රී බුදුන් නොදක්නාහු ය. පැවිද්ද සඳහා දරුවන් පූජා කළ මව්පියෝ ද වස් ආරාධනා කොට ඇප උපස්ථාන කළෝ ද වස් කාලයන්හි පිළිවෙත් පිරූ ගිහි පැවිද්දෝ ද ඒ මෛත්‍රී බුදුන් දැක නිවන් දක්නාහු ය.

මහජන කරුණාවෙන් සේවය කළ නිලදරුවෝ ද මං මාවත් ඉදිකර වුවෝ ද අම්බලම් තැනුවෝ ද දන්සැල් පැවැත්වූවෝ ද ඒ මෛත්‍රී බුදුන් දැක නිවන් දක්නාහු ය. ත්‍රිවිධ රත්නය උදෙසා පෙරහැර පැවැත්වූවෝ ද බුදු සිරිතෙන් සරසා වෙසක් තොරණ බැන්දෝ ද තුණුරුවන් උදෙසා පහන් කූඩු ඈ විසිතුරු කළෝ ද ඒ මෛත්‍රී බුදුන් දැක නිවන් දක්නාහු ය. නැති බැරි ඇත්තන්ගේ මංගල අවමංගල කටයුතු සම්පාදනය කළෝ ද මරණාධාර සමාගම් පැවැත්වෝ ද ගරු කළ යුත්තන්ට ගරුසරු දැක්වූවෝ ද ගුරු ගෞරවය පැවැත් වූවෝ පැවිද්දෝ ද ඒ මෛත්‍රී බුදුන් දැක නිවන් දක්නාහු ය.

සංඝාරාම පිදුවෝ ද දාගැබ් විහාර පන්සල් සුණු පිරියම් කළෝ ද බලු කපුටු ආදී සතුන්ට ආහාර දුන්නෝද ඒ මෛත්‍රී බුදුන් දැක නිවන් දක්නාහු ය. කඨින පින්කම් කළෝ ද වන්දනා ගමන්

ගියෝ ද ගෞතම බුදුපියාණන් උපත ලද, බුදුවූ, දම් දෙසූ, පිරිනිවන් පෑ තැන් වැඳ පුදා ගත්තෝද ඒ මෛත්‍රී බුදුන් දැක නිවන් දක්නාහු ය. මරණයට කැපවූ සතුන් මරණ භයින් මුදවා අභය දානය දුන්නෝ ද වෙහෙස මහන්සියෙන් ශ්‍රමය දානය දුන්නෝද ඉගැන්වීම් ආදියෙන් බුද්ධිදානය දුන්නෝ ද ඒ මෛත්‍රී බුදුන් දැක නිවන් දකින්නාහු ය වෙහෙර විහාරස්ථාන හා පාසල් - රෝහල් - අනාථ නිවාස සඳහා ඉඩ කඩම් පිදුවෝ ද ඒ මෛත්‍රී බුදුන් දැක නිවන් දක්නාහු ය.

තවද අනුන්ට ඊර්ෂ්‍යා නොකළෝ ද මුදිතාව දියුණු කළෝ ද මෙත් වැඩුවෝද ඒ මෛත්‍රී බුදුන් දැක නිවන් දකින්නාහුය. වෛර නො කළෝ ද කරුණාව පැතිරවූවෝ ද සාමය රැක්කෝ ද ප්‍රිය වචන කථා කළෝ ද ඒ මෛත්‍රී බුදුන් දැක නිවන් දක්නාහු ය. බදුපිළිම කරවා නේත්‍ර පිහිටවූවෝ ද සලාක දන් දුන්නෝද කොඩි කුඩ පහන් පිදුවෝ ද ඒ මෛත්‍රී බුදුන් දැක නිවන් දක්නාහු ය. සිප්හල් පිහිටුවා සර්වඥ ධර්මය ඉගැන්වූවෝ ද බෝධිඝර කරවූවෝද අන්ධකයන්ට පෙනීම ලබා දුන්නෝ ද ඒ මෛත්‍රී බුදුන් දැක නිවන් දකින්නාහුය. අනාථයන්ට උපකාර වූවෝ ද බෙහෙත් ගස් සිටවූවෝ ද ගස්කොළන් වැවූවෝ ද ඒ මෛත්‍රී බුදුන් දැක නිවන් දක්නාහු ය. ජලාශ පිහිටවූවෝ ද සතුන්ට බෙහෙත් කළෝ ද පෙහෙවස් රකින්නවුන්ට උවටැන් කළෝ ද ඒ මෛත්‍රී බුදුන් දැක නිවන් දක්නාහු ය. මියගිය ඥාති මිත්‍රාදීන් උදෙසා පින්කම් කළෝ ද වන සෙනසුන් පෝය ගෙවල් තැනූවෝ ද ඒ මෛත්‍රී බුදුන් දැක නිවන් දකින්නාහුය.

ඉහත දැක්වූ කුශල ධර්මයන්හි යෙදුනෝ මෛත්‍රී බුදුරජාණන් වහන්සේ දකින්නාහු කවරහෙයින් ද යත්?

මෙකී නොකී පින්කම්වල කුසල බලය නිසා ඔවුහු සියල්ලෝ ම මරණින් මතු චතුර්මහාරාජිකය, තාවතින්සය, යාමය, තුසිතය, නිර්මාණරතිය, පරනිම්මිතවසවර්තිය යන සදිව්‍ය ලෝකයන්හි සහ බ්‍රහ්මපාරිසජ්ජ, බ්‍රහ්මපුරෝහිත, මහාබ්‍රහ්මාදි ලෝකවල උපත ලබා ඒ මෛත්‍රී බුදු රජාණන් වහන්සේගේ කාලයේදී මිනිස් ලොවට බට තුසිත දිව්‍ය භවනය හා සමාන වූ, සකල සම්පත්තියෙන් අනූන, කේතුමතී නම් රාජධානියෙහි රජ - මැති - ඇමති - මහසල ඈ උසස් පවුල්වල උපත ලබන්නාහු ය. සිටු පවුල් බ්‍රාහ්මණ පවුල් සහ ගෘහපති පවුල්වල ආයුෂය, වර්ණය, සැපය, බලය, ප්‍රඥාවය යන කරුණු පසින් සපිරුණු පින්වතුන් - පින්වතියන්ව ඉපිද, ඒ මෛත්‍රී බුදුන් දකින්නාහු මය.

මෙ සේ සසර දී පුරණ ලද මේරු පින් ඇතිව උපන් ස්ත්‍රී පුරුෂයෝ ඒ මෛත්‍රී බුදුන් දැක තම තමන් පැතූ පරිදිම ඒ මෙතේ බුදුරජාණන් වහන්සේගෙන් බණ අසා දන් පහන් පවත්වා පිළිවෙත් පුරා අමාමහ නිවන් දක්නාහු ම ය.

## <u>සීහළවත්ථු කථාවේ එන මෛත්‍රී බුදුරදුන් පිළිබඳ කථාවක්</u>

තවද, මෙතේ බොසතාණන් වහන්සේ පිළිබඳව සීහළවත්ථු කථාවෙහි මෙබඳු ප්‍රවෘත්තියක් දක්වේ.

ලක්දිව රෝහණ ජනපදයෙහි කම්බෝජය නමින් ගමක් විය. ඒ ගමේ සිල්වත්, ගුණවත්, ධ්‍යාන ලාභී මලය නමින් මහතෙර නමක් විසීය. උන්වහන්සේ දවල් දානය පිණිස කම්බෝජ ගමට වැඩම කරද්දී දුටු එක්තරා සැදැහැවත් පුද්ගලයෙක්, තමා, කඩාගෙන එන උපුල් මල් මිට අටක් තෙරුන් දැක උන්වහන්සේට පිදීය. එක මිටකට මල් අටක් පමණ තිබුණි. එබඳු මිටි අටකි. තෙරණුවෝ මේ මල් මිටි අට අතට ගෙන දඩු ඇතුලට යන සේ පාත්‍රයෙහි තබා ගත්හ. උපුල් මල්වල සුවඳත් දැකුම්කළු බවත් නිසා අසීමිත බුද්ධාලම්බන ප්‍රීතියක් පහළ වී උන්වහන්සේ ඒ දෙසම බලාගෙන මේ මල් සෑගිරියට පූජා කරම්ද? නැත්නම් මහසෑයට පූජා කරම්ද? එහෙමත් නැතිනම් ශ්‍රී මහා බෝධීන් වහන්සේට පූජා කරම් දැයි සිතූහ. එවිට උන්වහන්සේ තුළ මෙබඳු අදහසක් පහළ විය. නැත - නැත, බුදුරජාණන් වහන්සේගේ දකුණු දළදා වහන්සේ තව්තිසා දිව්‍ය භවනයෙහි සිළුමිණි සෑයෙහි නිධන්කොට ඇත. මේ උපුල් මල් මිට අට සිළුමිණි සෑයේ දළදා වහන්සේට පුදන්නෙමි.

බුද්ධාලම්බන ප්‍රීතිය නිසා එකෙණෙහිම මලය තෙරණුවෝ අහසට නැගී මොහොතකින් තව්තිසා දෙව්ලොව වෛජන්ති ප්‍රාසාදය ඉදිරියෙහ පහළ විය. සක්දෙව් රජ දකුණු දළදාව ද කේශ ධාතූන් ද තැන්පත් කොට සිළුමිණි සෑය නමින් යොදුනක් වටැති මහ සෑයක් පිහිටුවා ඇත. මලය තෙරණුවෝ ඒ මහසෑය වෙත පැමිණ වැඳ ප්‍රදක්ෂිණා කොට සෑ මළුවෙහි වැඩ සිටියේය. සක්දෙව් රජ තෙමේ උන්වහන්සේ මෙසේ ප්‍රශ්න කළහ. සක්දෙව් රජතුමනි, අනාගතයෙහි ලොව පහළ වන මෛත්‍රී මහ බෝසතාණන් වහන්සේ සිළුමිණි සෑය වැදීමට දැන් මෙහි පැමිණෙන්නහුද? ස්වාමිනී, මලය තෙරුන් වහන්ස, මෙත් මහ බෝසතාණෝ මසකට සිව්වරක් වැදීම පිණිස මෙහි පැමිණෙන්නාහ.

මෙසේ සක්දෙව්රජ කියත් ම බලසම්පන්න දිව්‍යරාජයෙක් මහපිරිස් කැටුව සෑ මළුවට පැමිණියහ. මලය තෙරණුවෝ, මේ මෙතේ බෝසතුන් දැයි ඇසූ විට, ඒ අන්‍ය දිව්‍ය රාජයෙක් බවත්, හෙතෙමේ පෙර අනුරාධපුරයෙහි ඇඳුම් මැසීමෙන් ජීවත්වූ, බොහෝ පින් කළ සන්නාලියෙකැයි සක්දෙව් රජු පැවසීය. අනතුරුව තවත් දිව්‍ය පුත්‍රයෙක් මහ පිරිවර ඇතුව පැමිණ සෑ මළුවට වන්හ. ඔහු කවරෙක් දැයි තෙරුන් ඇසුවිට සක්දෙව් රජ පවසනුයේ, ස්වාමීනි මෙතෙමේ හරිතාලගම විසූ මහා දානපති හරිතාල තිස්ස ය. ඉන් අනතුරුව ඊටත් වඩා බලගතු දිව්‍ය පුත්‍රයෙක් සහපිරිවරින් පැමිණ සිළුමිණි සෑමළුවෙහි සිටගෙත්තේ ය. ඔහු කවරෙක් දැයි විමසූ විට මෙතෙමේ විහාරමහා දේවියගේ දෙවැනි පුත්‍රයා වන සද්ධාතිස්ස මහා රාජයා බව සක්දෙව් රජු මතක් කළේ ය. සතර වැනි වරට පැමිණියේ ඒ දෙවිවරු තිදෙනා ම එක්කළ විට ඇති වන බලයටත්, ඔපයටත්, ප්‍රභාස්වර බවටත් , පිරිස් බලයටත් වැඩි මහා දිව්‍ය රාජයෙකි. ඔහු කවරෙක් දැයි ඇසූ විට, මෙතෙමේ දුටුගැමුණු මහා රාජයා බව සක්දෙව් රජු දැන්වී ය. මෙකී බලසම්පන්න දේවතාවරු සිව්දෙන මහ පිරිස් සහිතව සතර දිසාවේ සිට ගත්විට, පස්වැනි වරට මහේශාක්‍ය - මහානුභාව සම්පන්න මෛත්‍රී බෝධිසත්වයෝ පැමිණියහ. එතුමෝ මලය තෙරුන් දැක ඔබ වහන්සේ කොයි රටකින් වැඩිසේක් දැයි විචාලෙන් මම ධර්මද්වීපයේ සිට පැමිණියෙමි යි පිළිතුරු දුණි.

ස්වාමිනී, ධර්මදිවීප වාසීන්ගේ ප්‍රාර්ථනාව කුමක් දැයි මෙතේ බෝසතුන් විමසූ විට, අනාගතයේ ලෝකයේ පහළ වන මෛත්‍රී බෝධිසත්වයාණන් වහන්ස, ඔබ වහන්සේ බුදුවන සමයෙහි ඒ මෛත්‍රී බුදුන් දැක නිවන් දකිම්වා යි සියල්ලෝම ප්‍රාර්ථනා කෙරෙතියි වදාළහ. එසේ නම්, මා පාරමීදම් පිරූ පරිදිම, මේ මහා භද්‍ර කල්පයෙහි පස් වැනි වරටත් ලොව්තුරා බුදු බවට පත්ව සසර දුකින් පෙළෙන සත්වයන් එතෙර කරම්හයි පවසා, සිළුමිණි මහසෑය වැඳ සිය පිරිසත් සමග තම දිව්‍ය විමානය වෙත ගියහ. මලය තෙරණුවෝ ද ස්වල්ප මොහොතකින් ආපසු සෘද්ධි බලයෙන් ම කම්බෝජ ගමට වැඩියහ.

**විරියාධිකෝ උත්තම බෝධිසත්තෝ**
**අනාගතේ කේතුමති පුරස්මිං**
**උප්පජ්ජ ලෝකස්ස හිතං කරෝති**
**වන්දාමි තං විතරාගි මුනින්දං**

වීර්යාධික වූ ඒ උත්තම මෛත්‍රී බෝසතාණන් වහන්සේ අනාගතයෙහි කේතුමතී රාජධානියෙහි උපත ලබා ලෝකයා ගේ හිත සුව පිණිස දම් දෙසන සේක. වීතරාගී ඒ මෛත්‍රී සම්මා සම්බුදු රජාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා.!
අපේ ගැමි වහරෙහි එන මෙවන් කවි බොහෝය.

**ඉද්ද මලක් මුනිඳුන්ට පුදන්න යි**
**සුද්ද දෙ මාපිය දෙපල ලබන්න යි**
**මේ මල් පිදුවා මට සිහිවන්න යි**
**මෙතේ බුදුන් දැක නිවන් දකින්න යි**

1818 ඉංග්‍රීසින් විසින් මහනුවර දී හිස ගසා දැමීමට නියමිතව සිටි වීර කැප්පෙටිපොල නිලමෙ තුමා ඒ ශෝචනීය මොහොතේ දී

**''ඉතෝ චුතෝහං වර ජම්බුදීපේ**
**හිමාලයයේ හේමමයම්හි කූටේ**
**කප්පායුකෝ දේවපතී භවිත්වා**
**මෙත්තෙය්‍ය නාථස්ස සුණෝමි ධම්මං**

යන ගාථව කියා නිමවෙද්දී ම ගෙලට කඩුපහර දෙන ලෙස වදකයාට කියා සිටියේය. මෙයින් චුතව මම හිමාල වනයෙහි රත්තරන් පව්වකට අධිගෘහිත කල්පායුෂ්ක දෙවියෙක් වෙම්වා.! අනාගතයේ ලෝකයේ පහළ වන මෛත්‍රී බුදුරදුන්ගෙන් බණ අසා නිවන් අවබෝධ කිරීමට ලබම්වා! යන්න එතුමාගේ ප්‍රර්ථනාව විය.

මේ ජනශ්‍රැති වලින් පැහැදිලි වන්නේ මහාභද්‍ර කල්පයෙහි අවසන් වරට පහළ වන මෙතේ බුදුන් දැක නිවන් දැකීමට බොහෝ දෙනා ප්‍රාර්ථනා කොට ඇති බව ය. අනිකුත් බෞද්ධ රට වල ජනී ජනයා ද මෛත්‍රී බුදුරදුන් පිළිබඳව මහත් බලාපොරොත්තු තබා ඇත. මෛත්‍රී බෝසතුන්ගේ ප්‍රතිමාවන්ට වැඳුම් පිදුම් කරන්නේ එහෙයිනි.

කේතුමතී රජධානිය නමින් ලියැවී ඇති මෙම ධර්ම ග්‍රන්ථය හොඳින් කියවා මෙහි සඳහන් පාපායන්ගෙන් වැලකී කුශලන්හි යෙදී සසර දුකින් එතෙර වීමෙන් ලබන අමාමහ නිවන් සම්පත් ලබා ගැනීමට උත්සාහ දරත්වා.!

ශ්‍රී ලංකා අමරපුර මහා සංඝ සභාවේ මහා ලේඛකාධිකාරි, ගල්කිස්සේ ශ්‍රී ධර්මපාල වංශාලංකාර සද්ධර්ම කීර්ති ශ්‍රී ත්‍රිපිටක විශාරද, **කොටුගොඩ ධම්මාවස** අනුනායක ස්වාමීන්ද්‍රයාණන් වහන්සේ විසින් ගල්කිස්සේ ශ්‍රී ධර්මපාලාරාමස්ථ දෙහිවල බෞද්ධෝදය සංගමයේ ආරාධනාවෙන් සම්පාදනය කරන ලද ''කේතුමතී රාජධානිය'' නමැති කුඩා ධර්ම ග්‍රන්ථය මෙතෙකින් සමාප්ත වුයේ ය.